# 1986 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

## හැඳින්වීම

1986 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි) සියයට 4.3 කින් ඉහළ නැගී ඇත. 1985 වර්ෂයේදී පැවති සියයට 5 ක් වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සමග මෙය සැසඳීමට පුළුවන. විදේශීය ශුද්ධ සාධක ආදායම් සඳහා ඉඩහළ විට ස්ථාවර මිළ ගණන් (1982) අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි (ද.ජා.නි.) සියයට 4.5 ක වර්ධනයක් වාර්තා විය. දළ ජාතික නිෂ්පාදිත වර්ධන අනුපාතිකය දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධන අනුපාතිකයට වඩා සුළු වශයෙන් වැඩි වීමට හේතු වූයේ, ඉකුත් වර්ෂයට වඩා 1986 වර්ෂයේදී විදේශීය ශුද්ධ සාධක වියදම් අඩු වීමය. වර්ෂය තුළදී ලෝක වෙළෙඳපොලේ පොළී අනුපාතික පහත බැසීම නිසා විදේශ ණය පොළී ගෙවීම් අඩු වීම මෙයට හේතු විය.

### 1 . 1 සංඛ්‍යා සටහන

### ජාතික ආදයම් සංඛ්‍යා 1984 – 1986


| ශීර්ෂය | වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය (සියයට) | |
|---|---|---|---|---|---|
| | 1984(අ) | 1985(අ) | 1986(අ) | 1985 | 1986 |
| 1. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 1,40,039 | 1,48,321 | 1,63,713 | 5·9 | 10·4 |
| 2. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 1,04,395 | 1,09,570 | 1,14,261 | 5·0 | 4·3 |
| 3. පවත්නා සාධක වියදම් මිළ අනුව ද.ජා.නි. | 1,36,638 | 1,44,921 | 1,59,852 | 6·1 | 10·3 |
| 4. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 1,01,399 | 1,06,741 | 1,11,565 | 5·3 | 4·5 |
| 5. මැදි වසර ජනගහණය ('000) .. | 15,599 | 15,837 | 16,117 | 1·5 | 1·8 |
| 6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය | | | | | |
| i. පවත්නා මිළ අනුව (රුපි.) .. | 8,759 | 9,151 | 9,918 | 4·5 | 8·4 |
| ii. ස්ථාවර මිළ අනුව (රුපි.) .. | 6,500 | 6,740 | 6,922 | 3·7 | 2·7 |


(අ) තාවකාලිකයි.


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

පවත්නා සාධක වියදම් මිළ ගණන් අනුව දළ ජාතික නිෂ්පාදිතය 1986 දී රුපියල් කෝටි 15,990 ක් වීයැයි ඇස්තමේන්තු කොට ඇත. ආර්ථිකයේ සමස්ත මිළ වෙනස්වීම මැනීම සඳහා භාවිතා කරනු ලබන දළ ජාතික නිෂ්පාදිත අවධමනකය සියයට 5.5 කින් ඉහළ නැග ඇතැයි ගණනය කර ඇත. 1985 වර්ෂයේ පැවැති සියයට 1.0 ක් වූ සාමාන්‍ය මිළ විචලනය සමග සසඳන කල කැපී පෙනෙන වෙනස් වීමක් ලෙස පෙනුනද, මෙය සාපේක්ෂව අඩු මට්ටමක මිළ වෙනස්වීමක් ලෙස සැළකිය හැකිය. රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව සියයට 1.8 කින් වැඩි වූ ශ්‍රී ලංකාවේ ජනගහණය 1986 දී දශ ලක්ෂ 16.1 ක් විය. මෙම වැඩි වීමට අනුරූපව ගැලපූ කල පවත්නා සාධක මිළ ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය 1986 දී රුපියල් 9,918 (ඇ.එ.ජ. ඩොලර් 354) දක්වා ඉහළ ගොස් ඇත. ඉකුත් වර්ෂයේදී වූ සියයට 3.7 ක වැඩිවීම සමග සසඳන කල, ඒක පුද්ගල මූර්ත ආදායම 1986 දී වැඩි වූයේ සියයට 2.7 කිනි. 1986 වර්ෂයේ ඒක පුද්ගල මූර්ත ආදායම් වර්ධන අනුපාතිකයේ පහත බැසීම ජනගහණ වර්ධන අනුපාතිකයේ සුළු වැඩි වීම මෙන්ම මූර්ත දළ ජාතික නිෂ්පාදිත වර්ධනයේ අඩු වීමද නිසා සිදු විය.

# දළ ජාතික නිෂ්පාදිතය




ශ්‍රී ලංකා මහ බැංකුව.

ආර්ථිකයේ විවිධ අංශ කෙරෙහි වූ බලවත් පීඩනයන් මධ්‍යයේ වුවද, 1986 වර්ෂයේදී ආර්ථිකයේ සමස්ත වර්ධන අනුපාතිකය සාමාන්‍ය මට්ටමකින් පවත්වා ගැනීමට හැකි විය. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයේ වඩාත්ම කැපී පෙනෙන සුළු අඩු වීම ඇති වූයේ කෘෂිකාර්මික අංශය තුළය. වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය ඇතුළත් මෙම අංශයේ එකතු කළ අගය වැඩි වූයේ සියයට 2.6 කින් පමණි. ඉකුත් වර්ෂයෙහි මෙම අංශය තුළ දක්නට ලැබුණු සියයට 8.6 ක් වූ කැපීපෙනෙනසුළු වර්ධන අනුපාතිකය සමග සසඳන කල මෙය තරමක් පහත් මට්ටමක් බව කිව හැකිය.

දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතියට අනුව, 1986 වර්ෂයේ ආර්ථික වර්ධනයේ ප්‍රධානතම දායකයන් ලෙස නිමැවුම් කර්මාන්ත, පතල් සහ කැනීම් කටයුතු, වෙළෙඳාම සහ රාජ්‍ය පරිපාලනය යන අංශ දැක්විය හැකිය. 1985 වර්ෂයේදී සාපේක්ෂව අඩු වර්ධනයක් වාර්තා කළ පතල් හා කැනීම් කටයුතු අංශය, 1986 දී හොඳින් ක්‍රියාත්මක වී සියයට 5.2 ක වර්ධන අනුපාතිකයක් දැක්විය. කෙසේ වෙතත්, 1986 දී හොඳම වර්ධන වේගයක් පවත්වා ගනු ලැබූයේ නිමැවුම් කර්මාන්ත අංශයයි. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙහි කර්මාන්තවල දායකත්වය ලත් මෙම අංශයේ වර්ධන අනුපාතිකය සියයට 8.4 ක් විය. කඩිනම් මහවැලි ව්‍යාපාරය යටතේ වූ මූලික වැඩ කටයුතු සම්පූර්ණ වී තිබීම නිසා, 1986 දී තැනීම් කටයුතු අංශය තුළ දක්නට ලැබුනේ අඩු වර්ධනයකි. අනෙක් අතට, මෑත වර්ෂවලදී දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනයට නොකඩවා ස්ථාවර දායකත්වයක් ලබාදුන් සේවා අංශය, මෙම වර්ෂයේදී සියයට 4.3 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කළේය.

**1 . 2 සංඛ්‍යා සටහන**

**දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය 1984–1986**

**ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව**


| අංශය | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| | 1984(අ) | 1985(අ) | 1986(අ) | 1985 | 1986 |
| 1. කෘෂිකර්මය, වන හා ධීවර .. | 26,113 | 28,366 | 29,106 | 8·6 | 2·6 |
| 1·1 තේ .. | 2,681 | 2,759 | 2,723 | 2·9 | – 1·3 |
| 1·2 රබර් .. | 878 | 851 | 856 | – 3·1 | 0·6 |
| 1·3 පොල් .. | 2,513 | 3,828 | 3,935 | 52·3 | 2·8 |
| 1·4 වී .. | 6,166 | 6,783 | 6,613 | 10·0 | – 2·5 |
| 1·5 අනෙකුත් (අතුරු භෝග, වන හා ධීවර ඇතුළු) .. | 13,875 | 14,145 | 14,979 | 1·9 | 5·9 |
| 2. පතල් සහ කැනීම් .. | 2,449 | 2,486 | 2,615 | 1·5 | 5·2 |
| 3. නිමැවුම් කර්මාන්ත .. | 15,390 | 16,193 | 17,558 | 5·2 | 8·4 |
| 3·1 වෘක්ෂ භෝග සැකසීම .. | 2,983 | 3,222 | 3,225 | 8·0 | 0·1 |
| 3·2 අනෙකුත් .. | 12,407 | 12,971 | 14,333 | 4·5 | 10·5 |
| 4. තැනීම් .. | 8,030 | 8,070 | 8,191 | 0·5 | 1·5 |
| 5. සේවා .. | 52,413 | 54,455 | 56,791 | 3·9 | 4·3 |
| 6. ද. දේ. නි. .. | 1,04,395 | 1,09,570 | 1,14,261 | 5·0 | 4·3 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදයම .. | – 2,996 | – 2,829 | – 2,696 | — | — |
| 8. ද. ජා. නි. .. | 1,01,399 | 1,06,741 | 1,11,565 | 5·3 | 4·5 |

(අ) තාවකාලිකයි. මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 වර්ෂයේදී සියලුම අංශවල ධනාත්මක වර්ධනයක් වාර්තා වූ අතර, අනු අංශවල ක්‍රියාකාරිත්වයෙහි සැළකිය යුතු වෙනස්කම් දක්නට ලැබුණි. උදාහරණයක් වශයෙන්, 1986 වර්ෂයේදී සමස්ත වර්ධනයට ප්‍රධාන බාධකයක් වූ කෘෂිකාර්මික අංශයෙහි ප්‍රධානතම භෝග දෙවර්ගය වූ තේ සහ වී සෘණාත්මක වර්ධනයක් පෙන්විය. රබර්වල එකතු කළ අගය සුළු වශයෙන් වැඩි වූ අතර, පොල් සම්බන්ධයෙන් එකතු කළ අගය සැළකිය යුතු අන්දමින් වැඩි විය. කෙසේ වෙතත්, මෙම අංශයෙහි වඩාත් කැපී පෙනෙන වර්ධනයක් ඇති වූයේ අතුරු ආහාර භෝග, සුළු අපනයන භෝග සහ උක් වගාව ඇතුළත් 'වෙනත්' කෘෂිකාර්මික අංශයෙහිය.

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

**ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව**




ශ්‍රී ලංකා මහ බැංකුව.

වැවිලි අංශයෙහි නිමැවුම් වර්ධනය අඩු වීමේ හේතුවෙන් නිමැවුම් කර්මාන්තයේ කෘෂි නිෂ්පාදන සැකසුම් කර්මාන්තවල එකතු කළ අගය බොහෝ දුරට නොවෙනස්ව පැවතිණි. මේ අනුව, මෙම අංශයෙහි මුළු මහත් වර්ධනය කම්හල් කර්මාන්ත අනු අංශය මත රඳා පැවතුණි. මෙම අංශය තුළ වඩාත් කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුනේ සියයට 15 ක නිමැවුම් වර්ධනයක් ඇති වූ පෞද්ගලික අංශයෙහිය. මේ හා සසඳන කල රාජ්‍ය කර්මාන්ත නිමැවුම සියයට 7.6 කින් වර්ධනය විය.

සේවා අංශයෙහි විදුලිබල, ගෑස්, ජල සහ සෞඛ්‍යාරක්ෂක සේවා මගින් එකතු කළ අගය සියයට 7.1 කින් ඉහළ නැගුණි. 1986 දී ප්‍රවාහණය, ගබඩා කිරීම් සහ පණිවුඩ හුවමාරු යන අංශවලින් එකතු වූ අගයෙහි සියයට 3.2 ක වර්ධනයක් ඇති වූ අතර, තොග සහ සිල්ලර වෙළෙඳාමෙන් එකතු වූ අගයෙහි සියයට 4.0 ක වර්ධනයක් ඇති විය. පසුව සඳහන් කළ අංශය තුළ අපනයන සහ ආනයන වෙළෙඳාමෙන් එකතු කළ අගය වැඩි වූයේ ඉතා සුළු ප්‍රමාණයකින් වන අතර, දේශීය වෙළෙඳ අංශයෙන් එකතු වූ අගයෙහි විශාල වැඩි වීමක් දක්නට ලැබුණි. බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපලවල එකතු කළ අගයෙහි වර්ධන අනුපාතිකය ඉකුත් වර්ෂයේදී සියයට 9.9 ක්ව තිබී, 1986 දී සියයට 4.0 දක්වා අඩු විය. කෙසේ වෙතත්, සේවා අංශය තුළ එකතු කළ අගයෙන් වඩාත් ඉහළ වර්ධනයක් වාර්තා වී ඇත්තේ රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂක කටයුතු අංශයෙහිය. මෙම අංශයෙහි සියයට 19 ක වර්ධන අනුපාතිකයක් වාර්තා වී ඇත. ප්‍රධාන වශයෙන් සංචාරක පැමිණීම් පහත වැටීම හේතුකොට ගෙන අනෙකුත් සේවා අංශයෙහි එකතු කළ අගයෙහි සෘණ වර්ධනයක් වාර්තා විය.

1986 වර්ෂයේදී ප්‍රාග්ධන සම්පාදන අනුපාතිකයෙහි සැළකිය යුතු වැඩි වීමක් ඇති විය. ඉකුත් වර්ෂයේ සියයට 2.6 කින් අඩු වූ තොග වෙනස්වීම් ඇතුළත් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ද.දේ.ප්‍රා.ස.) 1986 දී සියයට 9.8 කින් ඉහළ නැගුණි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි කැපී පෙනෙන වෙනසක් රාජ්‍ය අංශයෙන් වාර්තා විය. එය 1985 දී සියයට 11.0 කින් වැඩි වූ අතර, 1986 දී සියයට 23.0 ක වැඩි වීමක් වාර්තා කළේය. පසුගිය වර්ෂය තුළ සියයට 5.5 කින් අඩුවූ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවල දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය මෙම වර්ෂයේදී සියයට 6.4 කින් වැඩි විය. වෙළෙඳපොල මිළ ගණන් අනුව දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස සැළකීමේදී පසුගිය වර්ෂ දෙක තුළදීම දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි ප්‍රතිශතය 23.7 ක මට්ටමක පැවතින.

කලින් සඳහන් කළ පරිදි, 1986 දී වඩාත් කැපී පෙනෙන සුළු වර්ධනය ඇතිවූයේ කර්මාන්ත අංශය තුළය. කෘෂිකාර්මික අංශය තුළ මිශ්‍ර වූ ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. පොල් නිෂ්පාදනයෙහි කැපී පෙනෙන වැඩි වීමක්ද රබර් නිෂ්පාදනයෙහි සුළු වැඩි වීමක්ද ඇති වූ අතර, වටිනාකම අතින් ඉතාමත් වැදගත් භෝගයන් දෙක වන තේ සහ වී නිෂ්පාදනය පසුබෑස්මකට ලක් විය. සුළු අපනයන භෝග සහ අතුරු ආහාර භෝග යන අංශ දෙකෙහිම ක්‍රියාකාරිත්වය සතුටුදායක වූ අතර, සීනි නිෂ්පාදනයෙහිද සැළකිය යුතු වැඩි වීමක් වාර්තා විය.

තේ මිළ පහත බැසීමත් සමග පොහොර භාවිතය අඩු වීම සහ විශේෂයෙන් දිවයිනේ උස් සහ මැදි බිම් ප්‍රදේශවල පැවැති අයහපත් කාලගුණික තත්ත්වයද හේතුකොටගෙන, 1986 වර්ෂයේ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 211.3 දක්වා සියයට 1 කින් සුළු වශයෙන් පහත වැටුණි. මෙම පහත වැටීම මූලික වශයෙන්ම දක්නට ලැබුනේ රාජ්‍ය අංශය සතු වතුවලය. 1986 දී ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්හි (ජනවසම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි (ශ්‍රී.ලං.රා.වැ.සං.) ඒකාබද්ධ නිෂ්පාදනය සියයට 4 කින් පහත වැටුණි. වර්ෂය තුළදී මෙම සංස්ථා දෙක විසින් අමු දළු මිළදී ගෙන නිෂ්පාදනය කරනු ලැබූ තේ ප්‍රමාණයෙහිද අඩු වීමක් දක්නට ලැබුණි. මිළ ගණන් පහත වැටීම, කුඩා තේ ඉඩම් හිමියන්ගේ අංශයට පවා අහිතකර ලෙස බලපා ඇති ආකාරය මෙයින් පිළිබිඹු විය.

තේ නිෂ්පාදනයට වෙනස්ව 1986 වර්ෂයේ රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 138.5 දක්වා කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ එකකින් සුළු වශයෙන් වැඩි විය. රබර් වගා අංශයෙහි පොහොර භාවිතය වැඩි වීම නිසා හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 830 ක් වශයෙන් ගණන් බලා ඇති සාමාන්‍ය ඵලදාවේ වැඩිවීම මෙයට මුළුමනින්ම හේතු විය. රාජ්‍ය අංශයේ මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 55 ක් නිපදවනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් සතු රබර් වතු මෙම මුළු නිෂ්පාදනයෙහි වැඩි වීමට දායක විය. ජනතා වතු සංවර්ධන මණ්ඩල මගින් පාලනය කරනු ලබන වතුවල රබර් නිෂ්පාදනය සුළු වශයෙන් පහත වැටුනු අතර, කුඩා ඉඩම් ඇතුළු පෞද්ගලික අංශයේ වතුවල රබර් නිෂ්පාදනය බොහෝ දුරට ඉකුත් වර්ෂයේ පැවති මට්ටමෙහිම නොවෙනස්ව පැවතිණි.

1986 වර්ෂයේ පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 3,041 ක් විය. මෙතෙක් වාර්තාගත ඉහළම නිෂ්පාදනය වූ මෙම ප්‍රමාණය ඉකුත් වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 3 ක වැඩි වීමක් පෙන්වීය. පොල් වගා කරනු ලබන ප්‍රදේශවල පැවති හිතකර කාලගුණික තත්ත්වය මෙන්ම මෑත වර්ෂවලදී පොහොර භාවිතය වැඩිවීම මගින් ඇති වූ පසුකාලීන බලපෑමද පොල් නිෂ්පාදනයෙහි මෙම අඛණ්ඩ වැඩි වීමට විශාල වශයෙන් හේතු වූ බව කිව හැකිය.

කෙසේ වෙතත් ප්‍රධාන පොල් නිෂ්පාදන රටවල සැපයුම වැඩි වීමත්, අනිකුත් තරඟකාරී තෙල් සහ මේද වර්ග සුලභ වීමත් නිසා 1986 වර්ෂයේ වැඩි කාලයක් තුළ ලෝක වෙළෙඳ-පොලේ පොල් නිෂ්පාදන සඳහා අහිතකර වාතාවරණයක් පැවතුණි. 1986 වර්ෂයේ මුල් කාර්තු දෙකෙහි පොල් නිෂ්පාදන වැඩි ප්‍රමාණයක සාමාන්‍ය නැ. වි. ස. මිළ ගණන් ඉකුත් වර්ෂයේ පැවැති මිළ ගණන්වලින් හරි අඩක් පමණ විය. මිළ ගණන්වල මෙම ශීඝ්‍ර අඩුවීම වර්ෂයේ තුන්වන කාර්තුවේදීත් නොකඩවා දක්නට ලැබුණි. එහෙත්, පිලිපීනයේ අවිනිශ්චිත දේශපාලන වාතාවරණය සහ අනෙකුත් ප්‍රධාන පොල් නිෂ්පාදන රටවල සැපයුමේ පහත වැටීම නිසා සිව්වන කාර්තුවේදී මිළ ගණන් ඉහළ නැගීමේ උපනතියක් දක්නට ලැබුණි.

මෙතෙක් වාර්තාගත ඉහළම නිෂ්පාදනය වූ ඉකුත් වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 2.5 කින් අඩු වූ 1986 වර්ෂයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25,95,000 ක් විය. නිෂ්පාදනයේ අඩුවීම වැඩි වශයෙන්ම දක්නට ලැබුනේ මහ කන්නයේදීය. මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.7 ක් වූ 1985/86 මහ කන්නයේ වී නිෂ්පාදනය 1984/85 මහ කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 3.6 කින් අඩු විය. මේ අතර මෙම වර්ෂයේ යල කන්නයේ වී නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 0.9 බොහෝ දුරට ඉකුත් වර්ෂයේ යල කන්නයේ නිෂ්පාදනයට සමාන විය.

1986 වර්ෂයේ නිෂ්පාදනයේ පහත වැටීම මුළුමනින්ම මෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල වී වගා කරනු ලබන දිස්ත්‍රික්කවල පිළිබිඹු විය. මෙම ප්‍රදේශවල නිෂ්පාදනය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ, වගා කරනු ලැබූ බිම් ප්‍රමාණය සියයට 20 කින් පමණ අඩු වීම, විශාල වශයෙන් වගා පාලු වීම, විශේෂයෙන්ම, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය කෙරෙහි බලපෑ කන්තලේ වැව් බැම්ම පුපුරායාම වැනි කරුණුය. කෙසේ වෙතත්, අනෙකුත් ප්‍රදේශවල නිෂ්පාදනය විශාල වශයෙන් වැඩිවීම නිසා මෙම ප්‍රදේශවල මහ කන්නයේ නිෂ්පාදනය අඩු වීම බොහෝ දුරට සමහන් විය. වගා කෙරෙන බිම් ප්‍රමාණය පුළුල් වීම සහ පොහොර භාවිතය වැඩි වීම යන කරුණු මධ්‍යයේ වුවද, මෙම වර්ෂයේ යල කන්නයේ වී නිෂ්පාදනය ඉකුත් වර්ෂයේ යල කන්නයේ පැවති මට්ටමෙහිම නොවෙනස්ව පැවතුණි. වර්ෂයේ අවසාන භාගයේදී හටගත් අයහපත් කාලගුණික තත්ත්වය හේතුකොට-ගෙන සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය අඩුවීම මෙයට හේතු විය.

සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවල නිෂ්පාදනය ආරම්භවීමත් සමගම, 1986 දී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 34,391 දක්වා සියයට 94 කින් වැඩි විය. සීනි සංයුක්ත මණ්ඩලයේ සෙවනගල කම්හල මගින් මෙට්‍රික් ටොන් 6,533 ක්ද, පැල්වත්ත සීනි සමාගම මගින් මෙට්‍රික් ටොන් 13,116 ක්ද නිෂ්පාදනය කරන ලදී.

1986 වර්ෂයේදී අතුරු ආහාර භෝග අංශයෙහි තරමක දියුණුවක් දක්නට ලැබුණි. සෝයා බෝංචි, රතුළුනු, බඩ ඉරිඟු, කව්පි, රට කජු, තල, මුං ඇට සහ මිරිස් වැනි භෝග වර්ග ගණනාවකම නිෂ්පාදනයෙහි වැඩිවීම් වාර්තා විය. විශේෂයෙන් මහවැලි ජනාවාස ප්‍රදේශවල මෙම භෝග වගා කරන බිම් ප්‍රමාණය වැඩි වීම නිෂ්පාදනය වැඩි වීමට විශාල වශයෙන් හේතු විය.

මෑත වර්ෂවලදී දැඩි පසු බැස්මකට ලක්ව තිබූ මත්ස්‍ය නිෂ්පාදනය 1986 දී මෙට්‍රික් ටොන් 1,83,056 දක්වා සියයට 6 කින් පමණ සාමාන්‍ය වශයෙන් වැඩිවී යැයි වාර්තා විය. වයඹ සහ ඊසාන දිග ප්‍රදේශවලින් බටහිර සහ දකුණු දිග වෙරළාසන්න තීරයට ධීවරයින් සංක්‍රමණය වීම නිසා එම ප්‍රදේශවල ධීවර කර්මාන්තය පුළුල් වීම සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ව්‍යාප්ත වීම මෙසේ නිෂ්පාදනය වැඩි වීම කෙරෙහි බලපෑවේය. වර්ෂයේ කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂ 178 දක්වා එනම්, ඉකුත් වර්ෂයේ ප්‍රමාණයට වඩා, සියයට 2 කින් අඩු වී යැයිද, බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 667 දක්වා සියයට 8 කින් වැඩිවී යැයිද ගණන් බලා ඇත.

කර්මාන්ත අංශය 1986 වර්ෂයේදී සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. 1985 වර්ෂයේදී කර්මාන්ත අංශයේ සියයට 5 ක පුළුල් වීම සමග සසඳන විට 1986 දී එහි නිමැවුම මූර්ත වශයෙන් සියයට 12 කින් වැඩි විය. පෞද්ගලික අංශයේ කර්මාන්ත සහ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යාපාරවල අඛණ්ඩ වර්ධනය 1986 වර්ෂයේ මෙම අංශයේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමට ඉවහල් විය. පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුම් අගය පිළිවෙලින් සියයට 15 කින් සහ සියයට 8 කින් ඉහළ නැඟුණි. මූලික ලෝහ නිෂ්පාදිත, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත, ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිත, කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත ආදිය නිමැවුමෙහි විශාල වැඩි වීම් වාර්තා කළ අනු අංශ වේ.

පෞද්ගලික අංශයේ රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, ආහාර, පාන, දුම්කොළ හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි විශාල වැඩිවීම් වාර්තා විය. රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් අංශයෙහි නිමැවුම වැඩි වීමට බොහෝ සෙයින් හේතු වූයේ අපනයන වෙළෙඳපොළෙහි වැඩි වූ ඉල්ලුම සපුරාලීමේ අවශ්‍යතාවයයි. පෞද්ගලික අංශයට වඩා නිසැකවම අඩු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ, රාජ්‍ය අංශයේ කර්මාන්තවල ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය විමර්ශණය කිරීමෙහිදී සංස්ථා ගණනාවකට මුහුණපෑමට සිදුවූ නිෂ්පාදනය පිළිබඳ බැරෑරුම් ගැටළු සහිත වාතාවරණය සැළකිල්ලට ගතයුතුය. දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තාවය පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ ලංකා ඛණිජ වැලි නීතිගත සංස්ථාවේ කටයුතුවලට අහිතකර ලෙස බලපෑවේය.

රාජ්‍ය කර්මාන්ත සංස්ථාවල ක්‍රියාකාරිත්වයේ දියුණුව පිළිබිඹු කරමින් මෙම වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ කර්මාන්ත ව්‍යාපාර සඳහා රජයේ සංක්‍රාම ගෙවීම් තවදුරටත් අඩු විය. ඉකුත් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 686 ක් වූ සංක්‍රාම ගෙවීම් සමග සසඳන විට, 1986 වර්ෂයේදී එම ගෙවීම් රුපියල් දශ ලක්ෂ 265 ක් පමණක් විය. 1986 වර්ෂයේ සංක්‍රාම ගෙවීම්වලින් සියයට 74 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 195 ක් ප්‍රාග්ධන සංක්‍රාමද, සියයට 26 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 70 ක් ජංගම සංක්‍රාමද විය. ඉකුත් වර්ෂයේදී මෙන්ම 1986 දීද, රජයේ ප්‍රධාන සංක්‍රාම ලාභියා වූයේ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයයි.

1986 වර්ෂයේදී බලශක්ති අංශය තුළ ඇති වූ දියුණුව අතිශයින්ම සතුටුදායක විය. ඛණිජ තෙල් ආනයන මිළ ගණන් තියුණු අන්දමින් පහත වැටීම සහ ජල විදුලි බල ධාරිතාවය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම නිසා විදේශීය බලශක්ති මූලාශ්‍ර මත රඳා පැවැත්මට සිදුවීමේ බර

බොහෝ දුරට අඩු විය. විගැහි වට්නාකම අනුව ඛණිජ තෙල් ආනයන වියදම සියයට 52 කින් අඩු වූ අතර, 1985 දී සියයට 21 ක් වූ මුළු ආනයනවලින් ඛණිජ තෙල්වලට අදාළ කොටස 1986 දී සියයට 11 දක්වා අඩු විය. ජාත්‍යන්තර මිළ ගණන් පහත වැටීම මෙන්ම විදුලිය බලය උත්පාදනය සඳහා හිතකර දේශගුණික තත්ත්වයක් තිබුණේ වුවද, අධික ලෙස බලශක්ති මූලයන් ආනයනය කිරීම අධෛර්යමත් කිරීමේ ප්‍රතිපත්තිය අනුව යමින් දේශීය බලශක්ති මිළ ගණන් බොහෝ දුරට නොවෙනස්ව පවත්වාගෙන යන ලදී.

පාරිභෝගික මිළ ගණන් අනුව ගණනය කරනු ලබන උද්ධමන අනුපාතිකය ඉකුත් වර්ෂයට වඩා 1986 දී ඉතා පැහැදිලිවම ඉහළ අගයක් ගනු ලැබීය. 1986 දී කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි සියයට 8 ක වැඩි වීමක් වාර්තා විය. 1985 වර්ෂයේදී සිදුවූ සියයට 1.5 ක වැඩි වීම සමග සසඳන විට මෙම වර්ධනය තුළ සැලකිය යුතු ප්‍රවේගයක් පිළිබිඹු වෙයි. කාලච්ඡේද පදනම මත 1985 දෙසැම්බර් සිට 1986 දෙසැම්බර් දක්වා ගණනය කළ විට කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි සියයට 9 ක වැඩි වීමක් වාර්තා විය. ඉකුත් වර්ෂයේදී මෙහි අනුරූප වැඩිවීම සියයට 1.5 ක් විය. කෙසේ වෙතත්, 1978 සිට 1984 දක්වා කාලය තුළ වාර්තා වූ ඉලක්කම් දෙකකින් සමන්විත වූ උද්ධමන අනුපාතිකවලට වඩා සැළකිය යුතු අඩු අගයක් සහිත උද්ධමන අනුපාතිකයක් 1986 දී වාර්තා විය.

1986 වර්ෂයේදී පාරිභෝගික මිළ ගණන් ඉහළ යාමට බලපෑ සාධක කිහිපයක් විය. නිෂ්පාදනයට හානිකර වූ කාලගුණික තත්ත්වය, සැපයුම් අවහිරතා ජනිත කරමින් ඇතැම් ප්‍රදේශවල ප්‍රවාහන සේවාවන් වරින්වර ඇනහිටීම සහ 1986 වර්ෂයේ අවසාන භාගයේදී එතෙක් ලෝක වෙළෙඳ පොලෙහි නිෂ්පාදන මිළ ගණන් පහත වැටීමේ උපනතියට භාජිතව තිබූ පොල් සහ පොල් නිෂ්පාදනවල මිළ ගණන් ඉහළ යාම වැනි කරුණු මේ අතර විය. මේ හැර 1985 නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවලට අනුව වී සඳහා ඉහළ සහතික මිළක් නියම කිරීම, රෙදිපිළි ආනයන බද්ද, දුම්කොළ සහ මත්පැන් මත පැනවූ භාණ්ඩ බදු වැඩි කිරීම සහ තැපැල් ගාස්තු වැඩි කිරීම වැනි යෝජනාවල පූර්ණ බලපෑම 1986 වර්ෂය තුළදී ඇති විය. ජාත්‍යන්තර මුදල් වර්ග බොහොමයකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකය පිරිහීමට පත්වීම නිසා ආනයන සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ප්‍රමාණය වැඩි වීමද මෙහිලා බලපෑ තවත් සාධකයක් විය. කෙසේ වෙතත්, වර්ෂය තුළ ඉන්ධන සහ බලශක්ති මිළ ගණන්වල ස්ථායිතාවයක් පැවතීම නිසා උද්ධමනය කිසියම් ප්‍රමාණයකට සීමාකර තබා ගැනීමට හැකි විය. බැංකු ක්‍රමය තුළ පැවැති අතිරික්ත ද්‍රවශීලතාවය උරා ගැනීම සඳහා විවට වෙළෙඳ කටයුතු ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වෙමින් මෙම වර්ෂය තුළ මහ බැංකුව විසින් ගෙනයන ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්තියේ බලපෑම හේතුකොට ගෙන ඉල්ලුම් අංශයෙන්ද තරමක් අඩු පීඩනයක් මිළ මට්ටම කෙරෙහි ඇති කරන ලදී.

පාරිභෝගික මිළ ගණන් ඉහළ යාමේ උපනතියට ප්‍රතිවිරුද්ධ ලෙස, තොග වෙළෙඳ මිළ දර්ශකය අනුව මණිනු ලබන නිෂ්පාදකයින්ගේ මිළ ගණන් 1986 දී සියයට 2.9 කින් අඩු විය. 1985 දී සියයට 15.2 ක තියුණු අඩු වීමක් මෙහි දක්නට ලැබිණි. තොග වෙළෙඳ මිළ දර්ශකයේදී ප්‍රධාන අපනයන භාණ්ඩ සඳහා වැඩි බරක් තැබීම නිසා, මෙම අඩු වීම සිදු විය. මෙම ප්‍රධාන අපනයන භාණ්ඩ මිළ ගණන් මිළ දර්ශකයේ හැසිරීමට තදින් බලපායි. ඉකුත් වර්ෂයේදී අපනයන මිළ ගණන් සියයට 38.7 කින් පමණ සීඝ්‍ර ලෙස පහත වැටුණු අතර, 1986 දී සියයට 17.8 කින් අඩු වූ බව වාර්තා විය. 1985 දෙසැම්බර් සිට 1986 දෙසැම්බර් දක්වා කාලච්ඡේද පදනම මත ගත් කල සියයට 12.7 කින් මිළ දර්ශකය ඉහළ ගොස් ඇති අතර, ඉන් පිළිබිඹු වනුයේ වර්ෂයේ අවසාන කාලයේදී අපනයන මිළ ගණන් ඉහළ යාමට පටන් ගත් බවය.

අවම වැටුප් දර්ශකය අනුව සළකන විට, පඩිපාලක සභාව යටතට ගැනෙන සියළුම සේවකයින්ගේ නාමික වැටුප්, ඉකුත් වර්ෂයේදී වූ සියයට 8.3 ක වැඩිවීම හා සසඳන විට මෙම වර්ෂයේදී සියයට 5.4 කින් ඉහළ නැඟුණි. මිළ ගණන් ඉහළ යාමේ අනුපාතිකය සුළු වශයෙන් වේගවත් වීමේ පසුබිම යටතේ මූර්ත වැටුප් මෙම වර්ෂය තුළදී සියයට 2.4 කින් අඩුවී ගියේය.

කෘෂිකාර්මික අංශයේ සේවකයන් ලැබූ නාමික වැටුප් සියයට 5.3 කින් වැඩි වූ අතර, ඔවුන්ගේ මූර්ත වැටුප සියයට 2.4 කින් අඩු විය. කර්මාන්ත සහ වාණිජ අංශවල ඉහළම නාමික වැටුප් වැඩිවීම වාර්තා විය. මෙම වැඩි වීම ඉකුත් වර්ෂයේදී සියයට 11.2 ක්ද, මෙම වර්ෂයේදී සියයට 10.0 ක්ද විය.

1986 වර්ෂයේදී සංවිධිත අංශයෙහි වැටුප්වල සිදුවූ ප්‍රධානතම වෙනස්වීම හැටියට දැක්විය හැක්කේ, පාසැල් ගුරුවරුන් හැර අනෙක් සියළුම රජයේ සේවකයන්ගේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමයි. සේවකයන් තම උපරිම වැටුප් පරිමාණයෙහි එකතැන රැඳී සිටීම වැලැක්වීම මෙහි අරමුණ විය. නව වැටුප් ව්‍යුහයෙහි වැදගත් ලක්ෂණයක් වූයේ මෙතෙක් පැවති වැටුප් පරිමාණ සංඛ්‍යාව අඩු කිරීමයි.

දිවයිනෙහි සමස්ත සේවා නියුක්ති තත්ත්වය පිළිබඳව ලබාගත හැකි තොරතුරු සැබැවින්ම ඉතා දුර්ලභය. ලබාගත හැකි ඇස්තමේන්තුවලට අනුව 1986 දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ වැඩි වීමක්ද අර්ධ රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තියෙහි අඩු වීමක්ද දක්නට ලැබේ. තාවකාලික ඇස්තමේන්තු වලට අනුව, රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තියෙහි 1985 දී සියයට 1.5 ක වර්ධනයක්ද 1986 දී සියයට 2.0 ක වර්ධනයක්ද ඇති විය. අධ්‍යාපන, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය, ආරක්ෂක සේවා, රාජ්‍ය පරිපාලන සහ සමාජ සේවා යන අංශවල සේවා නියුක්තියෙහි සැළකිය යුතු වැඩි වීමක් වර්ෂය තුළදී වාර්තා විය.

1985 දී පැවති උපනතියට අනුරූප ලෙස 1986 දී අර්ධ රාජ්‍ය අංශය තුළ සේවා නියුක්තියෙහි අඩු වීමක් වාර්තා විය. මූල්‍යමය වශයෙන් ස්වයං රැඳියා ප්‍රතිපත්තියක් අනුගමනය කළ බොහෝ සංස්ථා විසින් තම සේවක මණ්ඩල අඩු වැඩි කිරීම පිළිබඳව දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. 1985 වර්ෂයේදී සියයට 2.4 කින් අඩුවූ මෙම අංශයෙහි සේවා නියුක්තිය 1986 දී සියයට 7.0 කින් පමණ පහත වැටුණි. ඉංජිනේරු වැඩ, මගී ප්‍රවාහනය, රෙදි විවීම, ඛණිජවැලි සහ සිමෙන්ති නිෂ්පාදන වැනි අංශවලට අදළ අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තියෙහි විශාලතම අඩුවීම දක්නට ලැබුණි. මේ හැර රාජ්‍ය වැවිලි අංශයෙහි සේවා නියුක්තියද සියයට 9.0 කින් පමණ පහත වැටුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද ව්‍යාපාර කටයුතු සහ ආයෝජන සැළසුම් පිළිබඳ සමීක්ෂණයට අනුව ඉකුත් වර්ෂයට වඩා 1985/86 වර්ෂයේදී පෞද්ගලික අංශයේ සමාගම්වල සේවා නියුක්තිය සියයට 15 කින් පමණ ඉහළ ගොස් තිබේ. 1986 දී මහ කොළඹ ආර්ථික කොමිෂම යටතේ ඇති ව්‍යාපාරවල සේවා නියුක්තිය ද සියයට 26 කින් වැඩිවී ඇත.

ලෝක ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය අඩු වී තිබුණු පසුතලයක, 1986 දී නොකඩවා දෙවන වසරටත් ශ්‍රී ලංකාවේ විදේශීය වෙළෙඳ අංශයේ අහිතකර උපනතීන් ඇති විය. කෘෂිකාර්මික අපනයන මිළ තියුණු ලෙස පහත වැටීම මුළු අපනයන වටිනාකම වර්ෂය තුළදී සියයට 21 කින් පහත වැටීමට බොහෝදුරට හේතු විය. කෙසේ වුවද, ආනයන වියදම් ද සියයට 15 කින් පහත වැටිණි. ජාත්‍යන්තර වෙළෙඳපොලේ බොර තෙල් මිළ තියුණු ලෙස පහත වැටීමත් වෙළෙඳ භාණ්ඩ මිළ පහත වැටීමත් මීට හේතුවූ ප්‍රධාන සාධක විය. මේ අනුව ඇතිවූ ආනයන අතිරික්තය 1985 අතිරික්තයට වඩා සුළු වශයෙන් අඩු වුවද, විදේශීය ගෙවීම් කෙරෙහි අඛණ්ඩ පීඩනයක් ඇති කරලීමෙහිලා ප්‍රමාණවත් විය.

ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි මිළ හැසිරීම්වලට අනුව ශ්‍රී ලංකාවේ විදේශීය වෙළෙඳාම 1986 වර්ෂය තුළදී, වාසි හා අවාසි යන දෙකෙහි සම්මිශ්‍රනයකට භාජනය විය. ශ්‍රී ලංකාවේ අවාසනාවකට මෙන්, කාර්මික රටවල ඇතිවූ ආර්ථික ප්‍රබෝධය, ප්‍රාථමික භාණ්ඩ සඳහා වූ දැඩි ඉල්ලුමක් ලෙසින් සංවර්ධනය වන රටවලට සංක්‍රමණය නොවීය. ඒ අනුව, ඉකුත් වර්ෂය හා

සසඳනකල, 1986 වර්ෂයේ දී සියලුම කෘෂිකාර්මික නිෂ්පාදිතයන්හි සාමාන්‍ය අපනයන මිළ සැළකිය යුතු තරම් පහළ මට්ටමක පැවතුණි. ආනයන අංශයේ, ඛණිජ තෙල් මිළ තියුණු ලෙස පහත වැටී, මූලික ආහාර ද්‍රව්‍ය ගණනාවක මිළ ගණන්ද පහත වැටුණ නමුදු, රටේ වෙළෙඳ අනුපාතය අහිතකර තත්ත්වයකට පත්වීම වැළැක්වීමට තරම් බලපෑමක් ඇති කිරීමට එය ප්‍රමාණවත් නොවීය. මහ බැංකුවේ වෙළෙඳ දර්ශක අනුව, 1986 දී අපනයන මිළ සියයට 11 කින් පහත වැටුනු අතර, ආනයන මිළ සියයට 6 කින් පහත වැටී ඇත. මෙම සාපේක්ෂ මිළ විචලනය හේතුකොට ගෙන වෙළෙඳ අනුපාතය සියයට 5 කින් පහත වැටුණි. මෙම අවාසිදායක වෙනස්වීම නිසා ශ්‍රී ලංකාවේ ආනයන හැකියාව තව දුරටත් අඩුවී ගියේය. 1986 වර්ෂයේ දී ඇති වූ වෙළෙඳ අනුපාතයෙහි පිරිහීම 1985 වර්ෂයේ දී වූ සියයට 20 ක පිරිහීමට අමතරව වූ අතර, එය ශ්‍රී ලංකා ආර්ථිකය ජාත්‍යන්තර වෙළෙඳපොලේ ඇතිවන අහේතුක වෙනස්වීම් වලට කෙතරම් දුරට ගොදුරු වන්නේ ද යන්න නැවතත් පෙන්නුම් කරන ලදී.

ගලපන ලද දත්ත අනුව, 1985 දී රුපියල් දශ ලක්ෂ 36,207 (විගැහි දශ ලක්ෂ 1,311) ක් වූ මුළු අපනයන ඉපැයීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 34,072 (විගැහි දශ ලක්ෂ 1,036) ක් විය. මෙය රුපියල් අනුව බලන කල සියයට 6 කද, විගැහි අනුව බලන කල සියයට 21 කද අඩු වීමක් විය. අපනයන වටිනාකම පහත වැටුනු දෙවන වර්ෂය මෙය විය. 1984 වර්ෂය සමහ සසඳන විට, 1985 වර්ෂයේදී අපනයන වටිනාකමේ පහත වැටීම රුපියල් අනුව සියයට 3 ක්ද, විගැහි අනුව සියයට 8 ක්ද විය. 1986 වර්ෂයේදී අපනයන ආදයම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, කෘෂිකාර්මික අපනයනවලින් ලැබුන ආදයම 1985 දී රුපියල් දශ ලක්ෂ 19,026 (විගැහි දශ ලක්ෂ 689) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 15,764 (විගැහි දශ ලක්ෂ 479) ක් දක්වා පහත වැටීමය. 1985/86 වර්ෂ තුළදී, ජාත්‍යන්තර වෙළෙඳපොලේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන සඳහා වූ ඉල්ලුමෙහි සාමාන්‍ය අඩු වීමක් විය. 1985 දී තිබූ අපනයන වටිනාකම්වලට වඩා තේ සහ පොල් නිෂ්පාදිත අපනයන වටිනාකම් සියයට 23 (විගැහි අනුව සියයට 35) ක් බැගින් පහත වැටුණි. රුපියල් වටිනාකම අනුව බලන කල රබර් සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදනවල අපනයන ඉපැයීම් සුළු වශයෙන් වැඩි වුවද, විගැහි අනුව ඉපැයීම් පිළිවෙලින් සියයට 14 කින් සහ සියයට 8 කින් පහත වැටුණි. අපනයන ඉපැයීම් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ජාත්‍යන්තර වෙළෙඳපොලේ කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍ය මිළ තියුණු ලෙස පහත වැටීමය. තේවල සාමාන්‍ය අපනයන මිළ, 1985 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 60.62 (විගැහි 2.19) සිට 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 44.52 (විගැහි 1.35) දක්වා තියුණු ලෙස පහත වැටිණි. රබර් සඳහා වූ සාමාන්‍ය නැ. වි. ස. මිළ 1985 දී කිලෝ ග්‍රෑමයකට විගැහි 0.77 සිට 1986 දී කිලෝ ග්‍රෑමයකට විගැහි 0.72 දක්වා සියයට 6 කින් පහත වැටිණි. මිළ පිළිබඳ අහිතකර තත්ත්වය තවදුරටත් උග්‍ර කරමින් පොල්තෙල්, කොප්පරා සහ කපාපු පොල් යන තෙවැදෑරුම් පොල් නිෂ්පාදිතයන්හි නැ. වි. ස. මිළ තියුණු ලෙස පහත වැටිණි.

1986 දී කාර්මික අංශයෙහි අපනයන රුපියල් වටිනාකම අනුව සියයට 11 කින් වර්ධනය වූ අතර, විගැහි වටිනාකම අනුව සියයට 7 කින් පහත වැටුණි. 1986 දී කාර්මික අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 15,878 (විගැහි දශ ලක්ෂ 483) ක් වූ අතර, 1985 දී රුපියල් දශ ලක්ෂ 14,295 (විගැහි දශ ලක්ෂ 517) ක් විය. ප්‍රධාන ඉපැයීම්, ඇඳුම් අපනයන (සියයට 21) සහ වෙනත් කාර්මික අපනයන (සියයට 58) වලින් ලැබිණ. අනෙකුත් කාර්මික අපනයන කාණ්ඩයේ ඉතා දිරිගැන්වෙන ක්‍රියාකාරිත්වයක් පෙන්වූයේ දියමන්ති අපනයනයන්ය. දියමන්ති අපනයන ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 313 (විගැහි දශ ලක්ෂ 11) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 1,047 (විගැහි දශ ලක්ෂ 32) දක්වා තෙගුණයකින් පමණ වැඩි විය. කාර්මික අපනයන අංශයේ සමස්ත ක්‍රියාවලිය අඩු වීමට හේතු වූයේ ඛණිජ තෙල් අපනයන වටිනාකම 1985 දී රුපියල් දශ ලක්ෂ 3,877 (විගැහි දශ ලක්ෂ 140) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 2,358 (විගැහි දශ ලක්ෂ 72) දක්වා සියයට 39 කින් (විගැහි අනුව සියයට 49 කින්) තියුණු ලෙස පහත වැටීමය.

ගලපන ලද රේගු දත්ත අනුව, 1986 දී මුළු ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 54,609 (විගැහි දශ ලක්ෂ 1,660) ක් වූ අතර, 1985 දී එය රුපියල් දශ ලක්ෂ 54,049 (විගැහි දශ ලක්ෂ 1,956) ක් විය. රුපියල් වටිනාකම අනුව, මෙය සුළු වැඩි වීමක් වූ නමුදු විගැහි වටිනාකම අනුව සියයට 15 ක අඩු වීමක් විය. මෙම අඩුවීම අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන දෙවර්ගයෙහිම පිළිබිඹු විය. 1985 දී රුපියල් දශ ලක්ෂ 10,387 (විගැහි දශ ලක්ෂ 376) ක් වූ ආයෝජන භාණ්ඩ සඳහා වූ වියදම, රුපියල් වටිනාකම අනුව සියයට 2 ක සුළු වැඩිවීමක්ද, විගැහි වටිනාකම අනුව සියයට 15 ක පහත වැටීමක් ද වාර්තා කරමින්, 1986 දී රුපියල් දශ ලක්ෂ 10,556 (විගැහි දශ ලක්ෂ 321) ක් විය. ඒ සමගම, ඉකුත් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 25,532 (විගැහි දශ ලක්ෂ 924) ක් වූ අන්තර් භාණ්ඩ සඳහා වූ ආනයන වියදම 1986 දී රුපියල් දශ ලක්ෂ 22,314 (විගැහි දශ ලක්ෂ 678) ක් විය. මෙය රුපියල් වටිනාකම අනුව සියයට 13 කද විගැහි වටිනාකම අනුව සියයට 27 කද පහත වැටීමක් විය. ඛණිජ තෙල්, තිරිඟු ඇට සහ පොහොර වැනි අන්තර් භාණ්ඩ සඳහා වූ වියදම සැළකිය යුතු ලෙස පහත වැටුණි. රුපියල් දශ ලක්ෂ 6,293 (විගැහි දශ ලක්ෂ 191) ක් වූ ඛණිජ තෙල් ආනයන වටිනාකම, ඉකුත් වර්ෂයේ ප්‍රමාණයෙන් අඩකටත් වඩා අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බොර තෙල් මිළ තියුණු ලෙස පහත වැටීමය. ආනයන පරිමාවේ වැඩිවීමක් වුවද, 1985 දී රුපියල් දශ ලක්ෂ 2,765 (විගැහි දශ ලක්ෂ 100) ක් වූ තිරිඟු ඇට ආනයන වටිනාකම 1986 දී රුපියල් දශ ලක්ෂ 2,370 (විගැහි දශ ලක්ෂ 72) දක්වා අඩු විය. මෙම වර්ෂ දෙක තුළ තිරිඟු ඇට මෙට්‍රික් ටොන් එකක සාමාන්‍ය මිළ විගැහි 150 සිට විගැහි 106 දක්වා තියුණු ලෙස පහත වැටීම මෙයට හේතු විය. අනෙක් අතට, 1986 දී රුපියල් දශ ලක්ෂ 18,609 (විගැහි දශ ලක්ෂ 566) ක් වූ පාරිභෝගික භාණ්ඩ ආනයන සඳහා වූ වියදම, රුපියල් වටිනාකම අනුව සියයට 30 කින්ද, විගැහි වටිනාකම අනුව සියයට 10 කින්ද ඉකුත් වර්ෂයට වඩා වැඩි විය. මෙම වැඩිවීම ආහාර සහ පාන වර්ග හැර අනෙකුත් සියළුම ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ වර්ගයන්හි පිළිබිඹු විය.

වර්ෂ ගණනාවක සිට පාරිභෝගික භාණ්ඩ ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහයේ ප්‍රබල ස්ථානයක් ගත් අතර, එය රටේ ගෙවුම් තුලනය අනම්‍ය තත්ත්වයකට පත්කළා පමණක් නොව සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ආනයන ලබා ගැනීම දුෂ්කර කාර්යයක් බවටද පත් කළේය. කෙසේ වුවද, විශේෂයෙන්ම හරිත විප්ලවයෙන් පසු රටේ ආහාර නිෂ්පාදනය වැඩිවත්ම, පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමාව අඩු කොට එමගින් වඩාත් නම්‍යවූත්, සංවර්ධනයට යෝග්‍යවූත්, ආනයන ව්‍යුහයක් ඇති කරලීමට හැකි විය. එබැවින්, 1984 වනවිට, තිරිඟු ඇට හැර, මුළු ආනයන පරිමාවෙහි වූ පාරිභෝගික භාණ්ඩ කොටස, සියයට 23 දක්වා අඩු විය. ඒ අනුව එකී වර්ෂයේ අන්තර් භාණ්ඩ සහ ආනයන භාණ්ඩ කොටස සියයට 76 දක්වා වැඩි විය. එසේ වුවද, 1985 වර්ෂයේදී මුළු ආනයන පරිමාවෙහි වූ පාරිභෝගික භාණ්ඩ කොටස සියයට 34 දක්වා වැඩි වෙමින් මෙම උපනතියෙහි ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් ඇති විය. 1986 දී මෙහි තවත් පසුබෑසීමක් ඇතිකරමින් පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණය සියයට 34 දක්වා වැඩිවිය. මුළු ආනයන පරිමාවෙහි වූ අන්තර් භාණ්ඩ ආනයන කොටස 1985 දී සියයට 47 සිට 1986 දී සියයට 41 දක්වා අඩු වීමට බොහෝ දුරට හේතු වූයේ, ඛණිජ තෙල් ආනයන වටිනාකම සැළකිය යුතු ලෙස පහත වැටීමය. කෙසේ වුවද මෑත වර්ෂ කිහිපය තුළදී ඉතා ඉහළ මට්ටමක වූ කෘෂිකාර්මික අංශයේ ආයෝජන පිළිබඳව සළකන කල, ආනයන සංයුතියෙහි උපනතිය වෙනස්වීම දැඩි අවධානයට භාජනය විය යුතු කරුණක් වනු ඇත.

විදේශ වෙළෙඳ අනුපාතය අහිතකර තත්ත්වයක පැවතියද, ඉකුත් වර්ෂය සමඟ සසඳන කල, වෙළෙඳ, සේවා සහ ජංගම ගිණුම්වල පැවැති හිඟයන්හි අඩුවීම් වාර්තා කරමින් 1986 වර්ෂයේ ගෙවුම් තුලනය තරමක දියුණුවක් පෙන්වීය. වෙළෙඳ ගිණුමේ හිඟය 1985 දී විගැහි දශ ලක්ෂ 711 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 644 දක්වා පහත වැටුන අතර, සේවා ගිණුමේ හිඟය වර්ෂ දෙක තුළදී විගැහි දශ ලක්ෂ 133 සිට විගැහි දශ ලක්ෂ 115 දක්වා අඩු විය. එසේම, ජංගම ගිණුමේ හිඟය 1985 දී විගැහි දශ ලක්ෂ 410 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 357 දක්වා පහත වැටුණු අතර, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් එය සියයට 6.9 සිට සියයට 6.5 දක්වා පහත වැටුණි. කෙසේ වුවද, ජංගම ගිණුමේ දියුණුවක් දක්නට ලැබුනද, වර්ෂය තුළදී සමස්ත ගෙවුම් තුලන තත්ත්වය තවදුරටත් අහිතකර වූ අතර, විදේශීය විනිමය සංචිත ද පහත වැටුණි.

## 1.3 සංඛ්‍යා සටහන
## ගෙවුම් තුලන සාරාංශය 1983 – 1986

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| ශීර්ෂ | | 1983 (අ) | 1984 (අ) | 1985 (අ) | 1986 (ආ) |
|---|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ (ශුද්ධ) | .. | – 20,168<br>(– 801) | – 11,850<br>(– 453) | – 19,801<br>(– 711) | – 21,017<br>(– 644) |
| සාධක නොවන සේවා (ශුද්ධ) | .. | 1,803<br>(73) | 1,666<br>(64) | – 201<br>(– 8) | 178<br>(3) |
| සාධක සේවා (ශුද්ධ) | .. | – 3,214<br>(– 129) | – 3,401<br>(– 130) | – 3,445<br>(– 125) | – 3,861<br>(– 118) |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | .. | 6,441<br>(256) | 7,031<br>(270) | 7,212<br>(262) | 8,251<br>(250) |
| නිල සංක්‍රාම (ශුද්ධ) | .. | 4,016<br>(160) | 5,154<br>(198) | 4,828<br>(172) | 4,988<br>(152) |
| ජංගම ගිණුමේ ශේෂය | .. | – 11,122<br>(– 441) | – 1,400<br>(– 51) | – 11,408<br>(– 410) | – 11,461<br>(– 357) |
| සමස්ත ශේෂය | .. | + 342<br>(+0·6) | + 7,062<br>(+297) | – 1,060<br>(– 110) | – 2,124<br>(– 74) |

ප්‍රධාන දර්ශක සමහරක්

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙළෙඳ අනුපාතය (1981 = 100) | .. | 113 | 134 | 108 | 102 |
| ශුද්ධ ඛණිජ තෙල් ආනයන | .. | 8,342<br>(332) | 7,394<br>(284) | 7,109<br>(257) | 3,936<br>(120) |
| ජංගම ගිණුමේ ශේෂය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | .. | 9·1 | 0·9 | 6·9 | 6·5 |
| දළ ජාත්‍යන්තර සංචිත | .. | 13,026<br>(499) | 18,942<br>(735) | 18,367<br>(611) | 17,152<br>(492) |
| ජාත්‍යන්තර සංචිත වලින් කළහැකි ආනයන මාස ගණන (ඇ) | .. | 3·2 | 4·4 | 4·4 | 3·4 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) පසු වර්ෂයන්හි ආනයන සඳහා, විගැහි වටිනාකම අනුව ඇස්තමේන්තු කර ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ගෙවුම් තුලනයේ සේවා ගිණුම විගැහි අනුව සලකා බලන කල 1986 දී පහළ මට්ටමක හිඟයක් පෙන්වීය. 1985 දී රුපියල් දශ ලක්ෂ 3,647 ක් (විගැහි දශ ලක්ෂ 133) වූ සේවා ගිණුමේ හිඟය 1986 දී රුපියල් දශ ලක්ෂ 3,683 (විගැහි දශ ලක්ෂ 115) ක් විය. මෙම අඩු වීමට හේතු වූයේ, පොළී ගෙවීම්, රජයේ වියදම් සහ විවිධ සේවාවන් සම්බන්ධයෙන් වූ ශුද්ධ ගෙවීම් අඩු වීමය.

ජාත්‍යන්තර වෙළෙඳපොලවල පොළී අනුපාතික පහත වැටීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් විගැහි සඳහා පොළී අනුපාතිකය අඩු කිරීම 1986 දී විදේශීය ණය සඳහා වූ පොළී ගෙවීම් අඩු කරලීමට ඉවහල් විය. මෙයට අමතරව, නොගෙවා ඉතිරිව ඇති වෙළෙඳ බැංකු වලින් ලබාගත් ණය මට්ටම 1985 දී විගැහි දශ ලක්ෂ 834 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 766 දක්වා පහත වැටීමද පොළී බර තරමක් දුරකට අඩුකර ලීමට උපකාරී විය. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ඇතුළු විදේශීය ණය සඳහා පොළී ගෙවීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 5,404 (විගැහි දශ ලක්ෂ 196) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 5,336 (විගැහි දශ ලක්ෂ 162) දක්වා සුළු වශයෙන් පහත වැටිණි. එසේ වුවද, ගෙවුම් තුලනයේ සේවා ගිණුමේ නොකඩවා පැවති

විශාලතම හර ශීර්ෂය පොළී ගෙවීම් විය. මෑත වර්ෂ කිහිපය තුළදී ගෙවුම් තුලන හිඟ පියවීම සඳහා වාණිජ බැංකු ණය වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සහ රාජ්‍ය අංශයේ ඇතැම් ආයතන විසින් ලබා ඇති අධික වෙළෙඳ ණය මෙයින්පෙන්නුම් කෙරේ.

1986 වර්ෂයේදී, සංචාරක කර්මාන්තය දළ ඉපැයීම් විගැහි වටිනාකම අනුව ඉකුත් වර්ෂයේ මට්ටමට වඩා සියයට 13.3 කින් අඩු වෙමින් තවදුරටත් පසුබෑසීමක් පෙන්නුම් කළේය. සංචාරක කර්මාන්තයේ දළ ඉපැයීම් 1986 දී විගැහි දශ ලක්ෂ 70 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර, 1985 දී එය විගැහි දශ ලක්ෂ 81 ක් විය. සංචාරක ව්‍යාපාරයට ඇතැම් අහිතකර වූ තත්ත්වයන් සහිත පසුබිමක් ඇති වීම නිසා, සංචාරකයින්ගේ පැමිණීම 1986 දී සියයට 10.6 කින් පහත වැටුන අතර, සංචාරකයෙකු විසින් වැය කළ සාමාන්‍ය මුදල 1985 දී විගැහි 315 සිට 1986 දී විගැහි 306 දක්වා සුළු වශයෙන් අඩු විය.

මෑත වර්ෂවලදී වැඩි වැදගත්කමක් දරූ ගෙවුම් තුලන ශීර්ෂය වූයේ, පෞද්ගලික ප්‍රේෂණ වශයෙන් වූ ලැබීම්ය. එසේ වුවද, මෙකී ශීර්ෂය පසුගිය වර්ෂවලදී පෙන්වූ උත්පලතාවය 1986 දීද ඒ අයුරින්ම පෙන්වීමට අපොහොසත් විය. වර්ෂය තුළදී රුපියල් වටිනාකම අනුව, දළ ලැබීම් සියයට 15.4 කින් වැඩි වුවද, විගැහි වටිනාකම අනුව සියයට 3.8 කින් පහත වැටිණි. 1985 දී රුපියල් දශ ලක්ෂ 7,920 (විගැහි දශ ලක්ෂ 288) ක්වූ පෞද්ගලික ප්‍රේෂණ 1986 දී රුපියල් දශ ලක්ෂ 9,142 (විගැහි දශ ලක්ෂ 277) ක් විය. ව්‍යාපෘති සහ භාණ්ඩ දීමනා ඇතුළත් නිල සංක්‍රාම 1985 දී විගැහි දශ ලක්ෂ 172 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 152 දක්වා පහත වැටිණි. මෙකී වෙනස්වීම්වල ශුද්ධ ප්‍රතිඵලය වූයේ, විගැහි වටිනාකම අනුව, පෞද්ගලික සහ නිල සංක්‍රාම දෙවර්ගයෙහිම මුළු ලැබීම් සියයට 7.4 කින් පහත වැටීමය.

පෞද්ගලික සහ නිල සංක්‍රාම වලින් වූ ලැබීම් භාණ්ඩ හා සේවා ගිණුමේ හිඟයෙන් අඩක් පමණ පියවීමට ප්‍රමාණවත් වූයෙන්, මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් වලින් පියවීමට ඉතුරු වූ ජංගම ගිණුමේ හිඟය රුපියල් දශ ලක්ෂ 11,461 (විගැහි දශ ලක්ෂ 357) ක් විය. දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් ගත් කල, 1985 දී සියයට 6.9 ක්වූ ජංගම ගිණුමේ හිඟය 1986 දී සියයට 6.5 දක්වා පහත වැටිණි. නිල සංක්‍රාම අත්හළ විට, ඉකුත් වර්ෂයේදී සියයට 9.9 ක් වූ මෙම අනුපාතය සමඟ සසඳන විට 1986 දී සියයට 9.3 ක් විය. 1982 සිට පැවැති පහළ බැසීමේ උපනතියට අනුව, මූල්‍ය නොවන ප්‍රාග්ධනය ගලා ඒම තවදුරටත් අඩුවූ අතර, 1986 දී පහත වැටීම සියයට 7.9 ක් විය. 1985 දී විගැහි දශ ලක්ෂ 58 ක් වූ පෞද්ගලික ප්‍රාග්ධන ශුද්ධ ලැබීම් 1986 දී විගැහි දශ ලක්ෂ 55 ක් විය. ඉකුත් වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 270 ක් වූ රාජ්‍ය අංශයේ ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් සියයට 8.5 ක පහත වැටීමක් පෙන්වමින් 1986 දී විගැහි දශ ලක්ෂ 247 ක් විය.

මූල්‍ය නොවන ප්‍රාග්ධන ශුද්ධ ලැබීම් ජංගම ගිණුම් හිඟය පියවීම සඳහා ප්‍රමාණවත් නොවූ-යෙන්, සමස්ත ගෙවුම් තුලනය රුපියල් දශ ලක්ෂ 2,124 (විගැහි දශ ලක්ෂ 74) ක හිඟයක් පෙන්නුම් කළේය. මෙම හිඟය පියවීම සඳහා රටේ විදේශීය වත්කම් යොදා ගැනීමට සිදුවිය. ඒ අනුව 1986 දී දළ විදේශීය වත්කම් සියයට 19 කින් පහත වැටුණි. 1985 වර්ෂයේදීත් දළ විදේශීය වත්කම් සියයට 17 කින් පහත වැටීමක් වාර්තා කර තිබුණි. ඉකුත් වර්ෂයේ අවසානය වනවිට, රුපියල් දශ ලක්ෂ 18,367 (විගැහි දශ ලක්ෂ 611) ක් වූ විදේශීය වත්කම් 1986 දී රුපියල් දශ ලක්ෂ 17,152 (විගැහි දශ ලක්ෂ 492) ක් විය. 1986 අවසානයට පැවැති දළ විදේශීය වත්කම් ප්‍රමාණය, 1987 සඳහා පුරෝකථනය කර ඇති ආනයනවලින් මාස 3.4 ක් සඳහා ප්‍රමාණවත් විය.

1986 වර්ෂය තුළදී ඉන්දියානු රුපියල හැර අනෙකුත් සියළුම ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග වලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලෙහි වටිනාකම පහත වැටුණි. ඩොයිෂ් මාර්ක් සහ ජපන් යෙන්වලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 24 කින් පහත වැටුණි. එහි අගය ප්‍රංශ

ප්‍රැන්කුවට ප්‍රතිමුඛව සියයට 18.4 කින්ද, එ. ජ. ඩොලරයට ප්‍රතිමුඛව සියයට 3.9 කින්ද, විගැහිවලට ප්‍රතිමුඛව සියයට 13.7 කින් පහත වැටුණි. එසේ වුවද, 1986 දී ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 4.3 කින් වැඩි විය.

විදේශීය ණය ප්‍රමාණය හා එහි වර්ධන අනුපාතිකය ඉකුත් වර්ෂ කිහිපය තුළදී දැඩි අවධානයට ලක් වූ කරුණක් විය. විශේෂයෙන්ම කෙටි කල්පිරීමක් සහිත විදේශ වගකීම් වේගයෙන් වැඩිවීම, ගෙවුම් තුලන පාලනයෙහිදී දැඩි සීමා කිරීමේ සාධකයක් වී ඇත. 1985 දී රුපියල් දශ ලක්ෂ 94,303 (විගැහි දශ ලක්ෂ 3,162) ක් වූ කෙටි කාලීන ණය සහ වෙළෙඳ ණය ඇතුළත් ආපසු ගෙවීමට ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය, 1986 දී රුපියල් දශ ලක්ෂ 1,13,308 (විගැහි දශ ලක්ෂ 3,262) ක් විය. 1985 දී විගැහි වටිනාකම අනුව සියයට 4.0 කින් වර්ධනය වූ මෙම ණය ප්‍රමාණය 1986 දී සියයට 3.2 කින් වැඩි විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සලකන කල ආපසු ගෙවීමට ඇති ණය ප්‍රමාණය පසුගිය දෙවර්ෂය තුළදී සියයට 53.8 සිට 59.8 දක්වා වැඩි විය. එසේ වුවද වාණිජ ණය ගැනීම් සම්බන්ධයෙන් ආපසු ගෙවීමට ඇති ණය ප්‍රමාණය වර්ෂය තුළදී විගැහි දශ ලක්ෂ 13 කින් පහත වැටුන බව සඳහන් කළ යුතුව ඇත. අළුතින් ණය නොගැනීම නිසා ජා. මූ. අ. හි ශ්‍රී ලංකාවේ ණය වගකීම නොකඩවා දෙවන වර්ෂයේදීත් අඩු විය. මෙකී වෙනස්කම් රටේ ණය තත්ත්වය සුළු වශයෙන් හෝ සැනසිලිදයක තත්ත්වයකට පත්කිරීමට හේතුවිය.

දිගු හා මැදි කාලීන ණය ආපසු ගෙවීම හා සියළුම විදේශීය ණය සඳහා වූ පොළීවලින් සමන්විත ණය සේවා ගෙවීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 9,362 (විගැහි දශ ලක්ෂ 340) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 11,644 (විගැහි දශ ලක්ෂ 356) දක්වා වැඩි විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගත් ණය ආපසු ගෙවීම් ඇතුළත්ව ණය ආපසු ගෙවීම් වර්ෂ දෙක තුළදී රුපියල් දශ ලක්ෂ 4,533 (විගැහි දශ ලක්ෂ 166) සිට රුපියල් දශ ලක්ෂ 6,837 (විගැහි දශ ලක්ෂ 210) දක්වා වැඩි විය. එසේ වුවද, ජාත්‍යන්තර වෙළෙඳපොළේ පොළී අනුපාතික පහත් මට්ටමක පැවතීම සහ වර්ෂය තුළදී ජා. මූ. අ. විසින් විගැහි පොළී අනුපාතිකය පහත හෙළීම හේතුකොටගෙන ජා. මූ. අ. ගණුදෙනු සම්බන්ධ ඒවාද ඇතුළුව, පොළී ගෙවීම් සහ සේවා ගාස්තු ගෙවීම්, 1985 දී රුපියල් දශ ලක්ෂ 4,829 (විගැහි දශ ලක්ෂ 175) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 4,806 (විගැහි දශ ලක්ෂ 146) දක්වා පහත වැටිනි.

සමස්තයක් වශයෙන් 1986 ගෙවුම් තුලනයේ ඇතිවූ වෙනස්කම් අධෛර්‍යමත් කරවන සුළු විය. ආරක්ෂණ තොග රැස් කිරීම සඳහා ඉහළ ආනයන පරිමාවන් පවත්වා ගැනීම අවශ්‍ය වූ හෙයින් පහත වැටුනු භාණ්ඩ මිළ ගණන්වල පූර්ණ වාසිය භුක්ති විඳීමට ශ්‍රී ලංකාවට නොහැකි විය. මෙයට අමතරව, ඉකුත් වසරේදී මෙන්ම, ආරක්ෂක කටයුතු හා සම්බන්ධ ආනයන, ගෙවුම් තුලනය කෙරෙහි දැඩි පීඩනයක් ඇති කළේය. එසේ වුවද, වර්ෂය මුළුල්ලේම රටේ ප්‍රධාන කෘෂිකාර්මික අපනයන කෙරෙහි බලපෑ වෙළෙඳ භාණ්ඩවල පහත් මිළ ගණන් අධෛර්‍යමත් කරවන සුළු අත්දැකීමක් විය. රටතුළ නොකඩවා පැවැති සිවිල් කලබලවලින් බාධා පැමිණුන සංචාරක කර්මාන්තය, ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ ලකුණු වර්ෂය තුළදී පෙන්වීමට අපොහොසත් විය. අනෙක් අතට, ඉකුත් වර්ෂ වලදී වාණිජ ණය ගැනීම් අධික ලෙස පිහිට කර ගැනීම, රටේ විදේශීය ණය වගකීම් අධික වීමට තරමක් දුරට හේතු විය. මෙකී වර්ධනයන්හි සමස්ත ප්‍රතිඵලය වූයේ, විනිමය අනුපාතිකය කෙරෙහි අඛණ්ඩ පීඩනයක් ඇතිවීම හා වර්ෂය තුළදී විදේශීය වත්කම් තවදුරටත් පහත වැටීමය.

1986 රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය 1985 ට වඩා තරමක යහපත් බවක් හඟවනු ලබයි. රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවයන් වසර ගණනාවක් තුළම නොකඩවා මුදල් සැපයුම, මිළ ගණන්, ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතිකය කෙරෙහි පීඩනයක් ඇති කරමින් සාර්ව ආර්ථික අස්ථායිතාවයන් ඇති කිරීමට බලපෑ ප්‍රධාන සාධකයක් විය. මෙම පසුබිම තුළ යහපත් බවක් පෙන්නුම් කළ රාජ්‍ය මූල්‍ය කටයුතු සතුටුදයක ප්‍රගතියක් ලෙස සැළකිය හැකි නමුදු, අයවැය හිඟය තවදුරටත් ආර්ථික අස්ථායිතාවයන් ඇති කරන සාධකයන් වශයෙන් පවතින බව සඳහන් කළ යුතුව ඇත.

22508
21 APR 2009



## 1 . 4 සංඛ්‍යා සටහන

## රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සංඛ්‍යා 1982 – 1986

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1982 | 1983 | 1984 | 1985(අ) | 1986(අ) |
|---|---|---|---|---|---|
| ආදායම .. | 17,809 | 25,210 | 37,731 | 39,010 | 41,955 |
| වියදම .. | 37,900 | 46,816 | 53,593 | 64,685 | 67,551 |
| පුනරාවර්තන වියදම අත්තිකාරම් ගිණුම් කටයුතු ඇතුළුව .. | 19,231 | 25,083 | 31,842 | 34,156 | 34,602 |
| වර්තන ගිණුමේ හිහය (–) අතිරික්තය (+) .. | –1,422 | + 128 | +5,889 | +4,854 | +7,353 |
| ප්‍රාග්ධන වියදම .. | 18,669 | 21,733 | 21,750 | 30,529 | 32,949 |
| සමස්ත අයවැය හිහය .. | 20,091 | 21,606 | 15,861 | 25,676 | 25,596 |
| පියවීම | | | | | |
| විදේශීය .. | 8,794 | 10,950 | 11,251 | 12,205 | 13,575 |
| දේශීය බැංකු නොවන .. | 7,606 | 10,146 | 6,589 | 8,520 | 8,963 |
| දේශීය බැංකු .. | 4,006 | 1,204 | –2,644 | 7,451 | 2,299 |
| මුදල් ශේෂ භාවිතය .. | – 315 | – 694 | 666 | –2,501 | 760 |
| **දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස** | | | | | |
| ආදායම .. | 17·9 | 20·7 | 24·5 | 24·0 | 23·4 |
| වියදම .. | 38·2 | 38·5 | 34·9 | 39·8 | 37·6 |
| පුනරාවර්තන වියදම අත්තිකාරම් ගිණුම් කටයුතු ඇතුළුව .. | 19·4 | 20·6 | 20·7 | 21·0 | 19·3 |
| වර්තන ගිණුම් හිහය (–) අතිරික්තය (+) .. | – 1·4 | + 0·1 | + 3·8 | + 3·0 | + 4·1 |
| ප්‍රාග්ධන වියදම .. | 18·8 | 17·9 | 14·1 | 18·8 | 18·4 |
| සමස්ත අයවැය හිහය .. | 20·2 | 17·8 | 10·3 | 15·8 | 14·3 |
| පියවීම | | | | | |
| විදේශීය .. | 9·9 | 9·0 | 7·3 | 7·5 | 7·6 |
| දේශීය බැංකු නොවන .. | 7·7 | 8·3 | 4·3 | 5·2 | 5·0 |
| දේශීය බැංකු .. | 4·0 | 1·0 | – 1·7 | 4·6 | 1·3 |
| මුදල් ශේෂ භාවිතය .. | – 0·3 | – 0·6 | 0·4 | – 1·5 | 0·4 |

(අ) තාවකාලික

මූලයන්: මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 රාජ්‍ය මූල්‍ය කටයුතුවල යහපත් තත්ත්වයක් ඇතිවීම සාධක කිහිපයක ප්‍රතිඵලයකි. පළමුව, බදු වර්ග ගණනාවකින්ම ලැබූ ආදායම් අඩු වුවද, ආනයන බදු, සුරා බදු සහ බදු නොවන ආදායම් මගින් වූ ඉහළ ලැබීම් නිසා රජයේ සමස්ථ ආදායම ඉහළ මට්ටමක පවත්වා ගනු ලැබීය. දෙවනුව, අංශ කිහිපයකින්ම ඇතිවූ අධික වියදම් සඳහා වූ ඉල්ලීම් මධ්‍යයේ වුවද, පුනරාවර්තන වියදම්වල වර්ධනය අවම මට්ටමක පවත්වා ගන්නා ලදී. මෙකී තත්ත්වයන් ජංගම ගිණුම් ක්‍රියාකාරිත්වය වඩා යහපත් කිරීමට ඉවහල් විය. මේ අනුව, 1986 වර්ෂයේදී අයවැයෙහි ජංගම ගිණුමේ අතිරික්තය රුපියල් දශ ලක්ෂ 7,353 ක් විය. 1985 දී ජංගම ගිණුමේ අතිරික්තය වූයේ රුපියල් දශ ලක්ෂ 4,854 කි. ප්‍රාග්ධන වියදම් සියයට 8 කින් වැඩි වුවද, ජංගම ගිණුමේ වූ දිරිගැන්වෙන ක්‍රියාකාරිත්වය මධ්‍යයේ වර්ෂයේ සමස්ත අයවැය කටයුතුවලින් රුපියල් දශ ලක්ෂ 25,596 ක අයවැය හිහයක් ඇති කෙරිණි. මෙය වර්ෂය සඳහා මුලදී ඇස්තමේන්තු කළ අයවැය හිහයට වඩා සුළු වශයෙන් අඩු වීමකි. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අයවැය හිහය සියයට 14.3 ක් වූ අතර, එය 1985 දී සියයට 15.8 ක් විය. මේ අතර වර්ෂ දෙක තුල ශුද්ධ මූල්‍ය හිහයද සියයට 11.6 සිට සියයට 10.1 දක්වා අඩු විය. බැංකු නොවන අංශයන්ගෙන් භාණ්ඩාගාර බිල්පත් වලට කෙරුනු දයකත්වය වැඩිවීම පහත් මට්ටමක වූ අයවැය හිහය සමග දැකිය හැකි තවත් විශේෂත්වයකි. මෙකී හිතකර වර්ධනයන් අයවැය හිහය

පියවීමේ උද්ධමනකාරී මූල්‍යකරණය වෙත රජයේ නැඹුරුවීම අඩු කිරීමට හේතු වූ අතර, එකී මූල්‍යකරණය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් 1985 දී සියයට 2.9 සිට 1986 දී සියයට 1.7 දක්වා පහත වැටුණි.

අයවැයෙහි තරමක යහපත් ක්‍රියාකාරිත්වයක් පැවතුනද, 1986 රාජ්‍ය මූල්‍ය කටයුතු වලින් දුනට ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ක්‍රමයේ දුෂ්කරතාවයන් හා සීමා බාධකයන් විදහා දක්වන බව පිළිබිඹු වේ. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම 1985 දී සියයට 24 සිට 1986 දී සියයට 23 දක්වා අඩුවූ අතර, ප්‍රාග්ධන වියදම සියයට 18.8 සිට සියයට 18.4 දක්වා ආන්තික වශයෙන් අඩුවිය. අත්තිකාරම් ගිණුම් කටයුතුද ඇතුළත්ව පුනරාවර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 1985 දී සියයට 21 සිට 1986 දී සියයට 19 දක්වා අඩු විය. අනෙක් අතට පසුගිය වර්ෂයේ මෙන්ම ණය ආපසු ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 4.2 ක් ලෙස නොවෙනස්ව පැවතිනි.

ඉහත දක් වූ රාජ්‍ය මූල්‍ය ලක්ෂණයන්ගෙන් පෙන්නුම් කෙරෙනුයේ සම්පත් මෙහෙයවීමේ රජයේ හැකියාව දැඩි සීමාවන්ට ලක්වීමක් තුළින් රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ තරමක දුර්වල වීමකි. විශේෂයෙන් රජයේ ආදායම විදේශ අංශයේ අහිතකර බලපෑම් වලට දැඩි ලෙස ලක්වීමේ නැඹුරුව පෙන්නුම් කරනු ලබන බැවින්, රජයේ ආදායම නොවෙනස්ව පවත්වා ගැනීමට අතිරේක රාජ්‍ය මූල්‍ය ප්‍රයත්නයන්ගේ අවශ්‍යතාව ඉහතකී තත්ත්වයන්ගෙන් අවධාරණය කෙරෙන තවත් කරුණකි. උදාහරණයක් ලෙස 1986 දී අපනයන බදු වලින් ලැබූ ආදායම සියයට 16 කින් අඩුවූ අතර, තේ අපනයනයන්ගෙන් පමණක් ලැබූ බදු ආදායම සියයට 21 කින් අඩුවිය. ඒ සමගම, පොල් අපනයන ප්‍රමාණය සියයට 18 කින් වැඩි වුවද, අපනයන බදු ආදායම තුනෙන් එකක ප්‍රමාණයකින් පහත වැටුනි.

රජයේ වියදම් ගැන සලකන කල්හි, වැටුප් හා දීමනා වෙනුවෙන් වන වගකීම් වැඩි වර්ධනයක් දක්වන වැය ශීර්ෂයකි. 1986 දී මෙම වියදම් සියයට 19 කින් වර්ධනය වී මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 26 ක් විය. පසුගිය වසරේ වැටුප් හා දීමනා සඳහා වූ වියදම පුනරාවර්තන වියදමෙන් සියයට 22 ක් විය. මේ අතර, වර්ෂය තුළදී රජයේ ණය සඳහා වූ පොළී ගෙවීම්, මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 27 ක් විය. මෙය පසුගිය වසරට වඩා සියයට 12 ක වැඩි වීමකි. මෙම වර්ධනය වෙමින් පවත්නා වියදම් ශීර්ෂ මගින් පෙන්නුම් කෙරෙනුයේ ලබාගත හැකි සම්පත් වලට වඩාත් සරිලන පරිදි රජයේ වියදම් පිරිමසා ගැනීමේ දැඩි රාජ්‍ය මූල්‍ය ස්ථාවරයක අවශ්‍යතාවයකි.

1986 මූල්‍ය වර්ධනයන්හි ප්‍රධාන ලක්ෂණය වූයේ විදේශීය බැංකු වත්කම්වල (ශුද්ධ) පහත වැටීම හා දේශීය ණය ප්‍රසාරණය අඩු වීම හේතුකොට ගෙන පුළුල් මුදල් සැපයුමේ ($M_2$) වර්ධන අනුපාතිකය සැළකිය යුතු ලෙස පහත වැටීමයි. රජයේ වියදම් නොකඩවා ඉහළ මට්ටමකින් පැවතීමත්, පෞද්ගලික අංශයෙන් ණය සඳහා වූ දුර්වල ඉල්ලුමත් නිසා, වර්ෂය මුළුල්ලේම වාණිජ බැංකුවල ද්‍රවශීලතාවය අධිකව පැවතිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් හා මහ බැංකුව විසින් සංචිත අවශ්‍යතා ලිහිල් කිරීමේ හේතුවෙන්, පොළී අනුපාතිකයන් පහත වැටුණි. එසේ වුවද, ආර්ථිකයේ පැවති මධ්‍යස්ථ උද්ධමන ප්‍රවනතා අනුව බලන කල පොළී අනුපාතික මූර්ත වශයෙන් ධන අගයක සාමාන්‍යයෙන් පැවතියේය. මුදල් නීති පනතේ 91 වගන්තිය යටතේ ස්වකීය සුරැකුම්පත් නිකුත් කිරීමෙන් මහ බැංකුව තවදුරටත් අතිරික්ත ද්‍රවශීලතාව ඇද ගැනීමෙහිලා ක්‍රියාත්මක විය. මේ අතර, ණය ප්‍රතිපත්තිවලට වෙළෙඳපල මූල් කොටගත් මුහුණුවරක් ලබා දීම පිණිස, 1984 දී පනවන ලද ඇතැම් ප්‍රමාණාත්මක ණය සීමා කිරීම් ලිහිල් කරන ලදී. මහ බැංකුව තවදුරටත් දැඩි සමස්ත මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේය. එහෙත් මෙම රාමුව තුළ, අපනයන සඳහා වැඩි ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීමෙන් හා ප්‍රමුඛතා අංශවල නිෂ්පාදනය දිරිගැන්වීමෙන්, ආර්ථිකයේ මූර්ත අංශය නගා සිටුවීමට ප්‍රයත්න දැරිය.

1986 දී මූල්‍ය අංශයේ වර්ධනයන් එකිනෙකට වෙනස් විය. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත පටු මුදල් සැපයුම ($M_1$) රුපියල් දශ ලක්ෂ 2,418 කින් නැතහොත් සියයට 13 කින් වැඩි විය. මෙය 1985 දී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 1,937 ක නැතහොත් සියයට 12 ක වැඩි වීමට බොහෝ දුරට සමාන විය. අනෙක් අතට, පටු මුදල් සැපයුම සහ වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු ඇතුළත් වන පුළුල් මුදල් සැපයුම ($M_2$) රුපියල් දශ ලක්ෂ 2,451 කින් වැඩි වූ අතර, 1986 දී පුළුල් මුදල් සැපයුමේ වැඩි වීම බොහෝ දුරට, පටු මුදල් සැපයුමේ වර්ධනය නිසා ඇතිවූ බව මින් දක්වේ. ප්‍රතිශත වශයෙන් බලන කල, 1985 දී සියයට 11 ක ඉහළ වර්ධනය හා සසඳන කල 1986 දී $M_2$ වැඩිවූයේ සියයට 5 කින් පමණි.

## 1 . 5 සංඛ්‍යා සටහන

### මූල්‍ය කටයුතු පිළිබඳ සංඛ්‍යා 1982 – 1986

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1982 | 1983 | 1984 | 1985 | 1986 |
|---|---|---|---|---|---|
| දේශීය ණයෙහි වෙනස .. | 8,431 | 6,895 | 633 | 9,300 | 4,883 |
| රජයට දෙන ලද ශුද්ධ ණය වැඩිවීම .. | 4,361 | 383 | – 2,979 | 5,793 | 2,198 |
| රාජ්‍ය සංස්ථාවලට දෙනලද ණය වැඩිවීම .. | 190 | – 292 | – 237 | 290 | 301 |
| සමුපකාර ආයතන වලට දෙන ලද ණය වැඩිවීම .. | – 106 | 635 | – 255 | – 263 | 120 |
| අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද ණය වැඩිවීම .. | 3,986 | 6,170 | 4,104 | 3,480 | 2,263 |
| බැංකු විදේශ වත්කම් (ශුද්ධ) වෙනස .. | – 568 | 815 | 6,777 | – 691 | – 414 |
| මුළු වත්කම්/වගකීම් වෙනස .. | 7,863 | 7,710 | 7,410 | 8,609 | 4,468 |
| පුළුල් මුදල් සැපයුම (M2) වැඩිවීම .. | 6,063 | 6,747 | 6,170 | 4,982 | 2,451 |
| අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම .. | 1,800 | 963 | 1,240 | 3,627 | 2,018 |

#### මූල්‍ය කටයුතුවල වැඩිවීම් ප්‍රතිශතයක් වශයෙන්

| | | | | | |
|---|---|---|---|---|---|
| මුළු දේශීය ණය වැඩිවීමේ සියයට ගණන .. | 24·8 | 16·3 | 1·3 | 18·6 | 8·2 |
| මුළු වත්කම් සහ වගකීම් වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් .. | 21·3 | 17·2 | 14·1 | 14·4 | 6·5 |
| මුළු දේශීය ණය වැඩිවීමේ රජයේ දායකත්වය ප්‍රතිශතයක් වශයෙන් .. | 51·7 | 5·6 | –470·4 | 62·2 | 45·0 |
| මුළු දේශීය ණය වැඩිවීමේ රාජ්‍ය නොවන අංශයේ දායකත්වය ප්‍රතිශතයක් වශයෙන් .. | 48·3 | 94·4 | 570·4 | 37·8 | 55·0 |
| වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | | | | | |
| පුළුල් මුදල් සැපයුම (M2) .. | 24·8 | 22·1 | 16·6 | 11·4 | 5·1 |
| පටු මුදල් සැපයුම (M1) .. | 17·3 | 25·4 | 14·1 | 11·5 | 12·9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 1,754 කින් නැතහොත් සියයට 18 කින් වැඩිවීම, 1986 වර්ෂය තුළදී $M_1$ හි වර්ධනය කෙරෙහි අතිශයින් බල පෑවේය. සංසන්දනාත්මකව බලන විට, 1986 දී මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 664 කින් නැතහොත් සියයට 7 කින් පමණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් $M_1$ හි ඉල්ලුම් තැන්පතු කොටස 1985 අගදී සියයට 48 ක්ව තිබී, 1986 අගදී සියයට 45 දක්වා පහත වැටුණි. මෙය අවුරුදු ගණනාවක් තිස්සේ බැංකු කටයුතු ජනප්‍රිය කරවීමෙහිලා උත්සාහ දරන රටක් වශයෙන්, අසතුටුදායක ප්‍රවණතාවයකි. $M_1$ හි ව්‍යවහාර මුදල්/තැන්පතු අනුපාතය සැහෙන කාලයක සිට සියයට 50 කට ආසන්නයේ පැවතුනි. එසේ වුවද, මෑත වර්ෂවලදී $M_1$ හි ව්‍යවහාර මුදල්/තැන්පතු අනුපාතයේ ඇතිවූ අසතුටුදායක වර්ධනය, සිවිල් අසහනතා හේතුකොටගෙන රටේ ඇතැම් ප්‍රදේශවල බැංකු සේවාවන් නිදහසේ ප්‍රයෝජනයට ගැනීමට මහජනයාට නොහැකි වීමෙන් හටගත් තාවකාලික සිද්ධියක් ලෙස සැළකිය හැකිය.

1986 වර්ෂයේ මූල්‍ය වර්ධනයන්හිලා සඳහන් කළයුතු එක් වැදගත් ලක්ෂණයක් වූයේ, 1985 දී රුපියල් දශ ලක්ෂ 3,044 ක නැතහොත් සියයට 11 ක වැඩි වීමටද ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු ක්‍රමය සාපේක්ෂ වශයෙන් වේගවත් වර්ධනයක් පෙන්වූ 1978 සිට 1984 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සියයට 35 ක සාමාන්‍ය වර්ධන අනුපාතිකයටද වෙනස්ව, 1986 දී ආසන්න මුදල් රුපියල් දශ ලක්ෂ 33 ක තරම් ඉතා සුළු ප්‍රමාණයකින් වැඩි වීමය. මේ අනුව ආයෝජන මාර්ගයක් වශයෙන් බැංකු තැන්පතු වල ආකර්ශණීයත්වය කැපී පෙනෙන පරිදි වෙනස්ව ඇති බව පෙනේ. රාජ්‍ය සංස්ථාවන්හි තැන්පතු අඩු වීම සහ අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන්ගේ තැන්පතු වර්ධනය හීනවීම යන කරුණුවල ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන් ආසන්න මුදල් වර්ධනය සෙමෙන් සිදු විය. 1986 දී රාජ්‍ය සංස්ථාවල කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,067 කින් නැතහොත් සියයට 18 කින් පහත වැටුණි. රාජ්‍ය වැවිලි සංස්ථාවේ සහ ලංකා විදුලි බල මණ්ඩලයේ තැන්පතුවල සැළකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි. කලින් සඳහන් සංස්ථාව, තේ වෙළෙඳ පොලේ උත්පාත තත්ත්වය පහත වැටීම නිසාත්, දෙවනුව සඳහන් ආයතනය ද්‍රවශීල අරමුදල් ආයෝජනය කිරීම පිණිස වෙනත් මාර්ග කෙරෙහි වැඩි කැමැත්තක් දැක්වීමත් මෙම තත්ත්වයට හේතු විය. 1986 අගදී ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 3,048 ක් විය. 1985 අවසානයට වූ එකී ආයෝජනයන් රුපියල් දශ ලක්ෂ 1,000 ක් විය.

මේ අතර ඉකුත් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 2,637 ක නැතහොත් සියයට 13 ක තියුණු වැඩි වීමක් වාර්තා කළ, අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන්ගේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු 1986 දී වාර්තා කළේ රුපියල් දශ ලක්ෂ 1,032 ක නැතහොත් සියයට 4 ක අඩු වර්ධනයකි. අනෙකුත් පෞද්ගලික ගණුදෙනු කරුවන්ගේ ආසන්න මුදල් වර්ධනය හීනවීමට හේතු වූයේ, වෙනත් කරුණු අතර, අපනයන අංශයේ උත්පලතාවයක් නොමැති වීම හා රටේ ඇතැම් ප්‍රදේශවල පැවැති සිවිල් අසහනය නිසා බැංකු සේවා පහසුකම් ලබා ගැනීම සීමාවීම යැයි කිව හැකිය.

නොකඩවා දෙවන වසරටත්, 1986 දී විදේශීය අංශය, මූල්‍ය සමස්තයන් කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති කළේය. 1985 දී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 691 ක නැතහොත් සියයට 7 ක පහත වැටීම හා සසඳන කල බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) 1986 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 414 කින් නැතහොත් සියයට 4 කින් පහත වැටුණි. ගෙවුම් තුලනය පැත්තෙන් බලන කල, හිතකර ප්‍රවණතා වශයෙන් වෙළෙඳ ගිණුමේ මෙන්ම ජංගම ගිණුමේ ඉකුත් වර්ෂයට වඩා අඩු හිඟයන් වාර්තා වුවද, විදේශාධාර පිළිබඳ අහිතකර වාතාවරණය මධ්‍යයේ මුළු හිඟය පියවීමට තරම් සම්පත් රාශිකරණය කර ගැනීමට රටට නොහැකි විය. 1986 දී විදේශීය බැංකු වත්කම් පහත වැටීම 1985 ට වඩා අඩු වුවද, රටේ ආර්ථික කළමනාකරණය කෙරෙහි විදේශීය අංශය නොකඩවා ඇති කරන පීඩනය ඉන් පිළිබිඹු වන හෙයින් සැළකිල්ල යොමු කළ යුතු කරුණක් වේ.

බැංකු විදේශ වත්කම් (ශුද්ධ) වර්ෂය තුළදී අඩුවීම හේතුවෙන්, 1986 වර්ෂයේදී මුදල් සැපයුමේ වර්ධනය සඳහා දායක වූ සාධකය වූයේ, දේශීය ණය ප්‍රසාරණයයි. 1986 දී දේශීය ණය ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 4,883 ක් නැතහොත් සියයට 8 ක් වූ අතර, 1985 දී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 9,300 ක නැතහොත් සියයට 19 ක දේශීය ණය ප්‍රසාරණය සමඟ සසඳන කල මෙය වඩාත් අඩු, වැඩි වීමකි. 1986 දී දේශීය ණය ප්‍රසාරණය අඩුවීම රජයට දෙන ලද ශුද්ධ ණය සහ පෞද්ගලික අංශයට සැපයූ දළ ණය යන දෙකෙහිදීම පිළිබිඹු විය. 1986 දී ණය වර්ධනයන්ගේ යහපත් ලක්ෂණයක් වූයේ, රජයේ ණය ඉල්ලුම අඩු වීමය. 1986 දී රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 2,198 කින් හෙවත් සියයට 11 කින් වැඩි විය. 1985 දී එහි රුපියල් දශ ලක්ෂ 5,793 ක හෙවත් සියයට 40 ක වඩා තියුණු වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේ වුවද, රජයට දුන් ශුද්ධ ණයෙහි අඩු වර්ධනයක් පැවතියද, එකී ණය මුළු බැංකු ණයෙහි

පුස්තකාලය
මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
මොරටුව.



ප්‍රතිශතයක් වශයෙන්, 1984 දී සියයට 29 සිට 1985 දී සියයට 34 දක්වාත් 1986 දී තවදුරටත් සියයට 35 දක්වාත් ඉහළ නැගුනේ, රජයේ අයවැය පියවීම සඳහා බැංකු අංශයේ නොකඩවා පැවති වැදගත්කම ඉස්මතු කරමිනි.

රජය විසින් බැංකු ණය කෙරෙහි වඩා විශ්වාසය තැබීම මෑත වර්ෂවලදී මූල්‍ය සහ ණය ක්ෂේත්‍රයෙහි ලා පැවැති ප්‍රධාන අස්ථායිකරණ සාධකයක් විය. 1986 වසරේදී මෙම උපනතියෙහි පැහැදිළි වෙනස් වීමක් දක්නට ලැබිණි. එක් අතකින් සමස්ත අයවැය හිඟය අඩු කර ගැනීම නිසාත් අනෙක් අතින් බැංකු නොවන අංශයේ මුදල් යෙදවීම් සැළකියයුතු පරිදි වැඩි කරගැනීම නිසාත් 1986 වර්ෂයේදී රජයට බැංකු අංශයෙන් ණය ගැනීම අඩු කිරීමට හැකිවිය. උදහරණයක් වශයෙන් බැංකු නොවන අංශයේ භාණ්ඩාගාර බිල්පත් දැරීම 1985 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,659 සිට 1986 අගදී රුපියල් දශ ලක්ෂ 3,909 දක්වා වැඩි විය. මෙහි ශුද්ධ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 2,250 ක් විය. මෙයට අමතරව, 1986 පෙබරවාරි මාසයේදී මහ බැංකුවේ ලාභවලින් රුපියල් දශ ලක්ෂ 1,779 ක් රජය වෙත පැවරීම බැංකු ක්‍රමය වෙතින් රජයේ ණය ගැනීම අඩුකරලීමට උපකාරී විය. එබැවින්, 1986 දී රජය විසින් බැංකු ක්‍රමයෙන් ලබාගත් ණය අඩු කරනු ලැබීමට තරමක් දුරට හේතු වූයේ පෞද්ගලික අංශයට ලබා ගැනීමට තිබූ සැළකිය යුතු අරමුදල් ප්‍රමාණයක් රජයට යොමු වීම නිසාය. මෙය මිළ ස්ථායීතාව පවත්වා ගැනීමට උපකාරී වන වර්ධනයක් වුවද, ඇතැම් විට ඉන් පෞද්ගලික අංශයට අහිතකර බලපෑම් ඇති විය හැකිය.

සංවර්ධනය අතින් බලන කල, 1986 වර්ෂයේ ණය ක්ෂේත්‍රයේලා වඩාත්ම අසතුටුදයක ලක්ෂණය වූයේ පෞද්ගලික අංශයේ ණය ඉල්ලුම විශාල ලෙස පහත වැටීමයි. එක් වසරක සිට ඊළඟ වසර දක්වා වන පදනමක් මත, රාජ්‍ය සංස්ථා, සමුපකාර ආයතන සහ අනෙකුත් පෞද්ගලික ගණුදෙනුකරුවන්ගෙන් සමන්විත පෞද්ගලික අංශයට සැපයූ දළ ණය රුපියල් දශ ලක්ෂ 2,684 කින් හෙවත් සියයට 7 කින් වැඩිවූ අතර, 1985 දී එම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 3,507 ක් නැතහොත් සියයට 7 ක් විය. පෞද්ගලික අංශයට දුන් දළ ණය වැඩි වීමෙහි ප්‍රධාන කොටසකට (සියයට 84 කට) හිමිකම් පෑවේ පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනුකරුවන්ය. කෙසේ වෙතත්, මෙම අංශයට දුන් දළ ණය 1986 දී වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 2,263 ක් හෙවත් සියයට 7 කින් පමණි. සංසන්දනාත්මකව බැලීමේදී 1985 වර්ෂයේදී මෙම අංශයට දෙන ලද ණයෙහි රුපියල් දශ ලක්ෂ 3,480 ක හෙවත් සියයට 12 ක වර්ධනයක් විය.

පෞද්ගලික අංශයේ අනෙකුත් අනු අංශ දෙකෙහි එනම්, සමුපකාර ආයතන සහ රාජ්‍ය සංස්ථා මගින් බැංකු ණය ප්‍රයෝජනයට ගැනීමෙහි උනන්දුවක් නොතිබුණි. මෙම අනු අංශ දෙකම එකතුව 1986 දී ලබාගෙන ඇත්තේ, පෞද්ගලික අංශයට දුන් දළ ණයෙන් සියයට 15 ක් පමණි. 1985 දී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 263 ක හෙවත් සියයට 17 ක පහත වැටීමට වෙනස්ව, 1986 දී සමුපකාර ආයතනවලට දුන් ණය රුපියල් දශ ලක්ෂ 120 කින් නැතහොත් සියයට 9 කින් ඉහළ නැඟුණි. සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම සඳහා දෙන ලද අත්තිකාරම්හි වර්ධනය මෙයින් මූලික වශයෙන් පිළිබිඹු විය.

1986 දී රජයේ සංස්ථාවලට දෙන ලද වෙළෙඳ බැංකු ණය රුපියල් දශ ලක්ෂ 301 කින් හෙවත් සියයට 7 කින් වැඩි වූ අතර, 1985 දීද, එකී ණය එයට බොහෝ දුරට සමාන ප්‍රමාණයකින් එනම්, රුපියල් දශ ලක්ෂ 290 කින් හෙවත් සියයට 7 කින් වැඩි විය. තේ මිළ පහත වැටීම හේතුවෙන් ඇතිවූ ද්‍රවශීලතා ගැටලුවල බලපෑම පිළිබිඹු කරමින් වර්ෂය තුළදී රාජ්‍ය වැවිලි සංස්ථා දෙක (රා. වැ. සං. හා ජනවසම) විසින් ලබාගත් ණය ප්‍රමාණය සැළකිය යුතු ලෙස වැඩි විය. මෙම සංස්ථා දෙක 1986 දී ලබාගත් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 792 කින් වැඩි විය. මේ අතර, වෙනත් රාජ්‍ය සංස්ථා කිහිපයක්ම වර්ෂය තුළදී බැංකු ණය ගැනීම් අඩු කළේය. ජාතික පේෂකර්ම සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 145) සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 71) ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 140) සහ නාගරික සංවර්ධන අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 167) මේ අතර විය.

47014

1986 වර්ෂය තුළදී පොළී අනුපාතික පහත වැටීමක් පෙන්නුම් කළේය. පොළී අනුපාතිකවල පහත වැටීම, සියළුම මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපල උපකරණයන් සම්බන්ධව වාගේම දක්නට ලැබිණි. තැන්පතු භාර ගන්නා ආයතන අතරින්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සිය තැන්පතු අනුපාතික, සුළු වශයෙන් පහත හෙලූ අතර, වාණිජ බැංකු සහ මූල්‍ය සමාගම්, ඔවුන්ගේ අනුපාතික, සැළකිය යුතු ප්‍රමාණයන්ගෙන් අඩු කරන ලදී. පොළී අනුපාතික අඩු කිරීම, මෙම ආයතනවල අරමුදල් පිරිවැය පහත වැටීමට හේතු වූ අතර, එමගින් ඔවුන්ගේ ණය අනුපාතිකයන් අඩු කිරීමට හැකි විය.

විශේෂයෙන්ම, වාණිජ බැංකු, සිය ණය අනුපාතිකයන් පහත දැමීමට උචිත තත්ත්වයක පැවතුණි. තැන්පතු අනුපාතික පහත දැමීමේ ප්‍රතිඵලයක් වශයෙන් අරමුදල් පිරිවැය පහත වැටීමට අමතරව, ශ්‍රේණිමත පදනම් වූ විශේෂ සංචිත අවශ්‍යතාවයන් ඉවත්කර ගැනීමේ වාසිය භුක්ති විඳීමටද බැංකුවලට හැකි විය. කෙසේ වුවද, ක්‍රියාත්මක වශයෙන් ගත්කළ, වාණිජ බැංකුවල ණයදීමේ අනුපාතිකයන් පහත වැටීම සුළු වූවා පමණක් නොව, බොහෝ දුරට ප්‍රමුඛතා අංශයන්හි ණය දීමේ අනුපාතිකයන්ට සීමා විය. බැංකු ක්‍රමය තුළ සැළකිය යුතු පරිදි අතිරික්ත ද්‍රවශීලතාවයක් පවත්නා තත්ත්වයක් යටතේ වාණිජ බැංකු ණය අනුපාතික පහළ වැටීම කෙරෙහි ඇති මෙම දැඩි බව සැලකිල්ලට ගතයුතු කරුණකි. එසේ වුවද, දිගු කාලීන ණය ආයතනවල, ණය අනුපාතිකයන්හි කැපී පෙනෙන අඩු කිරීම් දක්නට ලැබුණි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සියළුම කාණ්ඩවලට අයත් ණයවලට අදාල සිය පොළී අනුපාතිකයන් ප්‍රතිශත අංක දෙකකින් අඩු කළ අතර, ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය, ප්‍රතිමූල්‍ය ණය ක්‍රමයන්ගෙන් බාහිර ණය සඳහා වන සිය ණය අනුපාතිකයන්, වර්ෂයකට සියයට 14 සිට 21 දක්වා වූ පරතරයක සිට වර්ෂයකට සියයට 14 සිට 18 දක්වා වූ පරතරයකට අඩු කරලිය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී, කෙටි කාලීන මෙන්ම දිගු කාලීන මූල්‍ය වෙළෙඳපල උපකරණ සඳහා වූ පොළී අනුපාතිකවලද අඩුවීම් සිදු විය. 1986 ජනවාරි මාසයේදී ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ අනුපාතිකය වර්ෂයකට සියයට 11.5 සිට වර්ෂයකට සියයට 11 දක්වා පහත වැටුණි. විකිණීමේ සහ මිළට ගැනීමේ අනුපාතික කිහිපවරක්ම පහත වැටීමෙන් ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපල කටයුතු සම්බන්ධයෙන්ද මෙකී පහත වැටීමේ බලපෑම දක්නට ලැබුණි. මහ බැංකු සුරකුම්පත් සඳහා වූ මතුපිට පොළී අනුපාතිකයද 1986 ජනවාරි මාසයේදී වසරකට සියයට 14 සිට සියයට 12 දක්වා පහත වැටුණි. මෙකී මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරකුම්පත්වල පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 14 සිට සියයට 12 දක්වා පහත වැටුණු අතර, එහි කල්පිරෙන කාලය වර්ෂ හයක් සේ නොවෙනස්ව පැවතුණි.

වර්ෂය තුළදී පොළී අනුපාතිකයන්ගේ සිදුවූ වෙනස්වීම්වල ශුද්ධ ප්‍රතිඵලය වූයේ විවිධ මූල්‍ය ආයතන විසින් තැන්පතු සඳහා වූ අනුපාතිකයන් සහ භාණ්ඩාගාර බිල්පත්, මහ බැංකු සුරකුම්පත් හා රජයේ සුරකුම්පත් ආදී මූල්‍ය වෙළෙඳපල උපකරණ සඳහා පැවති අනුපාතිකයන් අතර පැවති පරතරය සැළකිය යුතු පරිදි අඩු වීමයි. මෙකී පරතරය අඩු වීම සහ බැංකු තැන්පතු දැරීම එතරම් ආකර්ශණීය නොවන පරිදි රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයෙහිලා ගන්නා ලද යම් පියවර නිසා මූල්‍ය උපකරණයන්හි විශේෂයෙන්ම රජයේ බිල්පත්වල ආයෝජනය කිරීම පෞද්ගලික අංශයට ආකර්ශණීය වූ ආයෝජන මාර්ගයක් විය. මේ අනුව ශ්‍රී ලංකාණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්වල මෙන්ම මහ බැංකු සුරකුම්පත්වලද බැංකු නොවන අංශය විසින් සැළකිය යුතු ආයෝජනය කිරීමේ නව ප්‍රවනතාවයක් මූල්‍ය වෙළෙඳපල සම්බන්ධව දක්නට ලැබුණි. උදාහරණයක් වශයෙන් 1986 දෙසැම්බර් අවසානයේදී නොපියවා පැවති මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙන් බැංකු නොවන අංශයේ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,909 ක් නැතහොත් සියයට 14.9 ක් විය. මෙය 1985 දෙසැම්බර් අගදී පැවති සමස්ත කොටස වූ සියයට 7.4 හා සැසඳේ.

47014

1984 සිට අනුගමනය කළ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිමය පුළුල් රාමුව තුළ රැඳී සිටිමින් ආර්ථිකයේ ඵලදායී අංශ වැඩි දියුණු කිරීම සඳහා 1986 දී මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවන ලදී. ආර්ථිකයේ අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීම සඳහා මහ බැංකුව විසින් නොකඩවාම සිය සුරැකුම්පත් නිකුත් කරන ලද අතර, ප්‍රමුඛතා අංශයන්ට ලබා ගත හැකි ණය තවදුරටත් පුළුල් කිරීම පිණිස සමහර ප්‍රතිමූල්‍ය ණය ක්‍රම යටතේ අනුග්‍රාහක පොළී අනුපාතිකයන් මත සැපයෙන පහසුකම් වැඩි කරන ලදී. මේ අතරම මූල්‍ය ප්‍රතිපත්තියට වඩාත් පාවුල වෙළෙඳපල හුරුවක් සැකසීමේ අටියෙන් 1984 මුල් අවධියේදී පනවන ලද ප්‍රමාණාත්මක ණය සීමා කිරීම් ලිහිල් කරන ලදී. ආර්ථිකයේ ඵලදායී අංශවල ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා හඳුන්වාදුන් ප්‍රතිපත්තිමය ක්‍රියාදමයන් අතර, මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පොළී අනුපාතික අඩු කිරීම, සමහර පහසුකම් යටතේ පැවති ප්‍රතිමූල්‍ය ප්‍රමාණය වැඩි කිරීම, සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන අපනයන සඳහා වන ප්‍රතිමූල්‍ය කාලසීමාව දීර්ඝ කිරීම, කාර්මික කටයුතු සඳහා පෞද්ගලික අංශයට දෙනු ලබන වාණිජ බැංකු ණය, 1984 මැයි මාසයේදී පනවන ලද ණය සීමාවන්ගෙන් නිදහස් කිරීම සහ ශ්‍රේණිමත පදනම්වූ විශේෂ සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය ඉවත්කර ගැනීම ද වේ. ශ්‍රේණිමත පදනම්වූ විශේෂ සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය ඉවත්කර ගන්නා ලද්දේ, සිය ණය අනුපාතික අඩුකිරීම සඳහා වාණිජ බැංකු දිරි ගන්වන අටියෙනි.

ප්‍රමුඛතා අංශයන්ට ණය ගලා යාම උනන්දු කරවීමේ අවශ්‍යතාවය පදනම් කොට සකස් කරන ලද ජාතික ණය සැලැස්මට අනුව ආර්ථිකයේ ණය ප්‍රවණතාවයන් මෙහෙයවීම මහ බැංකුව විසින් තවදුරටත් ඉටු කරන ලදී. ණය සැලැස්මේ ඇස්තමේන්තු හා සසඳන කල ණය උපයෝගීකරණ මට්ටම පහළ ගොස් තිබීම 1986 වර්ෂයේදී ණය ක්ෂේත්‍රයෙහි වූ ඉතාමත් කැපී පෙනෙන ලක්ෂණය විය. ප්‍රමුඛතා අංශ මගින් අඩු වශයෙන් ණය උපයෝගී කර ගැනීමට හේතු වූ කරුණු කිහිපයක් විය. පළමුව, සම්ප්‍රදායික අපනයන මිළ ගණන් පහත වැටීම නිසා වෙළෙඳ කටයුතු සඳහා වූ ණය ඉල්ලුම නාමික වශයෙන් අඩු විය. දෙවනුව, රාජ්‍ය වැවිලි අංශය සඳහා මැදි කාලීන ආයෝජන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. තෙවනුව, වර්ෂය තුළදී සමහර දිස්ත්‍රික්කවල පැවති අයහපත් කාලගුණික තත්ත්ව කෘෂි අංශයෙන් වූ ණය ඉල්ලුම අඩු කළේය.

පොදුවේ ආර්ථිකයේද, විශේෂයෙන් බැංකු ක්‍රමයේද අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවතුනද 1986 වර්ෂයේදී ප්‍රාග්ධන වෙළෙඳපලේ ක්‍රියාකාරිත්වය සතුටුදායක නොවීය. වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 130 ක් වටිනා කොටස් පිරිනමන ලද, නව කොටස් නිකුතු පහක් විය. රුපියල් දශ ලක්ෂ 87 ක් වටිනා කොටස් නිකුතු තුනක් සිදු වූ 1985 වර්ෂය හා සසඳන විට මෙය සුළු වැඩි වීමකි. 1983 වර්ෂයේ සිට නව කොටස් නිකුතු ක්‍රමිකව අඩු වෙමින් පවතින උපනතියක් පෙන්නුම් කළ අතර, එය 1983 දී 37 සිට 1984 දී 13 දක්වාද 1985 දී තවදුරටත් 3 දක්වා ද පහත වැටුණි. නොකඩවා පවතින සිවිල් නොසන්සුන්තාවය හේතුවෙන් ව්‍යාපාරික කටයුතුවල හටගත් අස්ථිරත්වය කොටස් වෙළෙඳපලේ කටයුතු පහත හෙලීමට හේතු වී ඇති බවක් පෙනේ.

1986 වර්ෂයේ ආර්ථික වර්ධනය, අභ්‍යන්තර හා බාහිර බාධක රාශියකට ගොදුරු විය. අභ්‍යන්තරික වශයෙන්, උතුරු හා නැගෙනහිර පළාත්වල සමහර ප්‍රදේශයන්හි හටගත් කැළඹීම් නිසා කෘෂිකර්මය, වෙළෙඳාම හා අනෙකුත් ආර්ථික කාර්යයන්හි ඇතිවූ තියුණු හා දැඩි පසුබෑම හේතුවෙන්, අතීතයේදී අත්දුටු වර්ධනයට වඩා වේගයෙන් වර්ධනය වීමට රටට තිබූ හැකියාව හීන විය. 1983 දී, සිදුවූ ජනවාර්ගික ගැටුම් නිසා ඇතිවූ හානියෙන් සංචාරක කර්මාන්තය තවමත් අත්මිදී නොමැත. බාහිර හේතුන් අතර, වෙළෙඳ භාණ්ඩ උත්පාතය අවසන්වීම, අපනයන ඉපැයීම් තියුණු අන්දමින් පහළ හෙලීමටත් ආර්ථිකයේ අනෙකුත් අංශයන් කෙරෙහි එහි අනිසි ප්‍රති විපාක ඇතිකර ලීමටත් ඉවහල් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1978–1985 කාලය තුළදී වසරකට සියයට 5.6 ක්ව පැවති සාමාන්‍ය වර්ධන අනුපාතිකය 1986 දී සියයට 4.3 දක්වා පහළ ගියේය. එහෙත් ආර්ථිකයෙහි වැදගත් අංශ බොහොමයක් කෙරෙහි ඉතා තදින් අහිතකර බලපෑම් එල්ලවී තිබියදීත් මෙවැනි වර්ධන වේගයක් පවත්වා ගැනීම සැළකිය යුතු කරුණකි.

DISCARDED

ආර්ථිකයේ ආංශීය වර්ධන ක්‍රියාකාරිත්වයන් ගෙන් පෙන්නුම් කෙරුනේ වඩාත් වැඩි අවධානය යොමු කළ යුතු වන එකී අංශවල පවත්නා අසීරුකම් හා අස්ථාවරත්වයන්ය. ආර්ථික වර්ධනයේ වැඩි ස්ථාවරත්වයක් ලභාකර ගැනීමට නම් ආර්ථික වර්ධනය කෙරෙහි වියවුල්කාරී හා අනිස්ථිරත්වය ඇති කරන සුළු බලපෑම් අභිබවා යන පරිදි 1977 ආර්ථික ප්‍රතිශෝධන වලට අයත් වැඩ පිළිවෙල නැවත සැළසුම් ගත කළ යුතුව ඇත. දිගු කාලීන වර්ධනයක් පවත්වාගෙන යාමේ හැකියාව තහවුරු කරනු පිණිස වර්ධන අංශයන්හි ආර්ථික කටයුතු ඉහළ මට්ටමක පවත්වා ගත හැකිවන අයුරින් අභ්‍යන්තරික ප්‍රතිපත්තීන් වඩාත් ශක්තිමත් කළ යුතුව ඇත. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල එකඟත්වයක් නොමැති විට ආර්ථික ගැලපුම් බර හුදෙක් මූල්‍ය ප්‍රතිපත්ති වලට පමණක් ඉසිලීමට නොහැකිය. රාජ්‍ය මූල්‍යමය හා ආර්ථිකමය වාතාවරණය ශක්තිමත් කරලනු පිණිස ජාතික අයවැයෙහි පවත්නා විශාල අසමතුලිතතා මකා දැමීම සඳහා ඉවහල්වන නිර්භයවූත්, නිර්මාණශීලීවූත්, යෝග්‍යවූත් පියවර ගත යුතුව ඇත.

ආර්ථික කළමනාකාරිත්වය නංවාලීමට නම් රාජ්‍ය මූල්‍ය හා අයවැය කටයුතු මනා අන්දමින් හැසිරවීම පිණිස සුපරීක්ෂාකාරී අන්දමින් සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිපත්තීන්හි පිහිටා දැඩි පරිශ්‍රමයකින් ක්‍රියා කිරීම අවශ්‍ය වනු ඇත. පවත්නා සම්පත් ප්‍රමාණය සහ ඒවා උකහා ගැනීමට ආර්ථිකයට ඇති ශක්ති ප්‍රමාණය සැළකිල්ලට ගත්කල, අය වැය පරතරය පියවීම සඳහා අපරිමානානුකූල වූ ඉතුරුම් පරිමාවක් යොද ගැනීම නිසා පෞද්ගලික අංශය වෙත ලැබෙන සම්පත් ප්‍රමාණය අඩුවී ගොස් ආර්ථික කළමනාකාරිත්වය දුර්වල වනු ඇත. මේ නිසා වැඩදායී අන්දමින් ප්‍රතිචාර නොදක්වාම පෞද්ගලික අංශයේ වර්ධනයට අවහිරතා සිදුවනු ඇත. අයවැය හිඟය පාලනය කර ගැනීම වඩාත්ම අවශ්‍ය වනුයේ එවැනි හිඟයන් අනිවාර්යයෙන්ම ගෙවුම් තුලනය කෙරෙහි අහිතකර බලපෑම් දනවන හේතුවෙනි. ශ්‍රී ලංකාවේ දැනට පවතින්නාවූ ප්‍රශ්නවල ස්වරූපය ගැන සලකන කල්හි අවශ්‍යයෙන්ම කළ යුත්තේ විශාල අයවැය හිඟයක් පියවීමට යොද ගන්නා සම්පත් ඉන් ඉවත්කර ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී තත්ත්වයක පවත්නා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යෙදවීමය. ආර්ථික ක්‍රියාවලියේ මන්දගාමීවූත් යටපත්වූත් ස්වභාවය, වෙළෙඳ භාණ්ඩ මිළ ගණන්වල දුර්වල ස්වරූපය සහ අහිතකර වෙළෙඳ අනුපාතික තත්ත්වය නිසා තවදුරටත් උග්‍ර අතට හැරීමෙන් පරිහානියට පත් ලෝක ආර්ථික වාතාවරණය සැළකිල්ලට ගත්කල්හි එකී සියලුම හේතූන් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හීන කරලීමට තුඩුදී ඇතැයි කිව හැකිය. එවැනි වාතාවරණයක් යටතේ විශාල රාජ්‍ය මූල්‍ය හිඟයන් ඇති වීමෙන් ගෙවුම් තුලනය, විනිමය අනුපාතිකය හා දේශීය මිළ කෙරෙහි ඇතිවන පීඩනය තවත් දැඩි වනු පමණක් නොව ක්ෂණිකව කළ යුතු ව්‍යුහයාත්මක ගැලපීම්වල අවශ්‍යතාවය තවත් කල් දැමීමටද හේතු වෙයි. සැළකිය යුතු මට්ටමකින් සිය ආර්ථික ව්‍යුහය විවිධාංගීකරණය කිරීමට ශ්‍රී ලංකාවට හැකි වී ඇතත්, අපනයනය සඳහා භාණ්ඩ සුළු ප්‍රමාණයක් කෙරෙහි පමණක් පටු අවධානයක් යොමුකර තිබීම ගෙවුම් තුලන තත්ත්වය නොකඩවාම උග්‍ර කිරීමට බලපෑ ප්‍රධාන ව්‍යුහයාත්මක ප්‍රශ්නයක් වී ඇත.

ඵලදායීව, යථානුරූපීව හා අඛණ්ඩව පවත්වාගෙන යාහැකි විසඳුම් සඳහා දැඩි අවධානයට භාජනය විය යුතු ප්‍රමුඛත්ව පදනමකින් යුතු ක්ෂේත්‍රයන් වනුයේ, පැහැදිලිවම විදේශීය හා රාජ්‍ය අයවැය අංශයන්ය. මෙම ක්ෂේත්‍ර අවශ්‍යයෙන්ම එකිනෙකට පරිබාහිර නොවන අතර සමීප ලෙස එකිනෙක හා බැඳී පවතී. ඇත්ත වශයෙන්ම, ගෙවුම් තුලන හිඟයන් සහ මිළ පීඩනයන් වූ කලී උද්ධමනාත්මක පදනමකින් තොරව ආර්ථිකය පවත්වා ගෙන යාමට හැකි තත්ත්වයකට වඩා වැඩි වේගයකින් දේශීය වියදම්හි අධික වර්ධනයක් ඇතිවූ විට හටගන්නාවූ විකල්පයීය ප්‍රතිචාර වේ. රාජ්‍ය මූල්‍ය ක්‍රමයේ මෙන්ම ගෙවුම් තුලනයන්හි හටගන්නා වූ ඇතැම් දුර්වලතාවයන් තාවකාලික සාධක නිසා සිදු වී ඇත. උදාහරණයක් වශයෙන්, මෑත වර්ෂවලදී රජයේ වියදම්වලින් මෙන්ම විදේශීය විනිමය සම්පත්වලින් වඩාත් ඉහළ ප්‍රමාණයක් ආරක්ෂක වියදම් මගින් උකහා ගන්නා ලදී. කෙසේ වෙතත්, මුහුණ පෑමට සිදුවී තිබෙන දුෂ්කරතාවලින් අධික ප්‍රමාණයක්ම උද්ගත වී ඇත්තේ ආර්ථිකයේ පවතින සම්පත් පදනමට වඩා අධික ලෙස වියදම් සිදු කිරීමට ගත් උත්සාහයන් නිසා බව පිළිගැනීමට සිදු වෙයි.

1978–1986 කාලච්ඡේදය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් රජයේ ආදයම සියයට 22.4 ක සාමාන්‍යයක් විය. අයවැයෙහි විශාලත්වය ගැන සළකා බලන කල මෙය එක්තරා ප්‍රමාණයක සතුටුදයක රාජ්‍ය මූල්‍ය ප්‍රයත්නයකි. අනෙක් අතට මෙම කාලච්ඡේදය තුල රජයේ වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 39.6 ක් වී ඇත. මේ අනුව, මෙම කාලච්ඡේදය තුළ අයවැයෙහි සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17.2 ක ප්‍රමාණයෙහි පැවතිණි. විදේශීය ඉතිරිකිරීම් සැළකිය යුතු ප්‍රමාණයක් යෙදවීමෙන් පසුව වුවද, එවැනි විශාල හිඟයන් ප්‍රසාරණාත්මක නොවන මාර්ගවලින් පියවීමට තරම් රටට පැහැදිලි වශයෙන් නොහැකි විය. මෙකී රාජ්‍ය මූල්‍ය අධිභාරයන් නිසා උද්ගතවන අවසාන ප්‍රතිඵලය නම් අයවැයෙහි ප්‍රසාරණාත්මක හිඟයන් ඇති වීමය.

වර්ෂයක් පාසා වූ මෙකී විශාල රාජ්‍ය මූල්‍ය හිඟයන් රටේ ආර්ථික කළමනාකාරිත්වය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කළේය. මූලික වශයෙන්ම, ප්‍රසාරණාත්මක මූලයන්ගෙන්, විශේෂයෙන්ම බැංකු ණය මගින්, අධික රාජ්‍ය මූල්‍ය හිඟයන් පියවීම නිසා ආර්ථිකයේ සමස්ත ද්‍රවශීල තත්ත්වය ඉහළ මට්ටමක පැවතුනේ, මිළ ගණන් මෙන්ම ගෙවුම් තුලනයන් කෙරෙහිද පීඩනයන් ඇති කරමිනි. අධික ලෙස ද්‍රවශීලතාවයක් මැවීමෙන් ඇතිවන අනිටු බලපෑම් අඩුකරලීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය සෑහෙන අන්දමින් සීමාකාරී විය යුතු විය. මේ අනුව ඇතැම් විටෙක අඩු ප්‍රමුඛතා අංශයට ණය දීම අත්හිටුවීමට සිදුවූ අතරම පොළී අනුපාතිකයන් සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටම්වල තබා ගැනීමටද සිදු විය. මෙමගින් පෞද්ගලික අංශයේ ආයෝජන මට්ටම කෙරෙහි අනිසි බලපෑම් ඇතිවූ බවට සැකයක් නැත.

අධික රාජ්‍ය මූල්‍ය හිඟයන් හා ඒවායේ ප්‍රතිඵල වශයෙන් ඇතිවූ ද්‍රවශීලතා මැවීම ගෙවුම් තුලනය කෙරෙහි බලපෑ අතර 1977 න් පසු වැඩි කාලයක් තුළම ගෙවුම් තුලනය පීඩනකාරී තත්ත්වයක් යටතේ පැවතිණි. දිගින් දිගටම ඇතිවූ විදේශීය ගෙවුම් හිඟයන් නිසා විදේශීය වගකීම් වේගයෙන් ගොඩනැඟුණ අතර, නිරන්තරවම සංචිත හීනවීමද සිදු විය. විදේශීය ගෙවුම් තුලන තත්ත්වය දුර්වලවීමෙන් ඇතිවූ බලපෑම නිසා එම කාලය තුළදී විනිමය අනුපාතිකයද පහත වැටිණි. 1977 නොවැම්බර් මාසයේ සිට 1986 දෙසැම්බර් දක්වා රුපියලේ සමුච්චිත අගය අඩුවීම එ. ජ. ඩොලරයට ප්‍රතිමුඛව සියයට 44 ක්, ස්ටර්ලින් පවුමට ප්‍රතිමුඛව සියයට 30 ක්, ඩොයිෂ් මාර්කයට ප්‍රතිමුඛව සියයට 52 ක් හා ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 64 ක් විය. මෙම කාලය තුළ විශේෂ ගැනුම් හිමිකම්වලට (විගැහි) ප්‍රතිමුඛව රුපියලේ අගය අඩුවීම සියයට 46 ක් විය. රුපියලේ අගය අඩු වීමෙන්, උද්ධමනය හා ආදයම් බෙදීයාම පිළිබඳ ගැටළු ඇති කරමින් ආනයන මිළ ගණන් ඉහළ යාම සිදුවූ බව පිළිගත යුතුය.

විවිධ දිරිදීම් හා දැඩි දේශීය ප්‍රතිපත්තීන් තිබියදීත්, විශාල අයවැය හිඟයන්, වෙළෙඳ අනුපාතයෙහි අහිතකර වෙනස්වීම් හා නොකඩවා සිදුවූ ගෙවුම් තුලන හිඟයන් හේතුකොටගෙන ප්‍රමාණවත් අන්දමින් දේශීය ඉතිරි කිරීම් සංචලනය කර ගැනීමට ආර්ථිකයට ඇති හැකියාවට බාධා පැමිණුනි. එසේ වුවද, දේශීය ඉතිරි කිරීම්වල අඩුව පිරිමැසීමට සතුටුදයක අන්දමින් විදේශීය සම්පත් ගලාඒමක් සිදුවිණි. වඩා ඉහළ ආයෝජන සහ තාක්ෂණික දනුම මාරුවීම තුළින් ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා විදේශීය ප්‍රාග්ධනයෙහි ඇති වැදගත්කම නොකිවමනාය. විදේශ ප්‍රාග්ධනය යොදා ගැනීම මගින් ලෝක ආර්ථිකයෙහි උදවන නව තත්ත්වයනට අනුව හැඩගැසීමට හා සංවර්ධන ශක්තිය ඉතා වේගයෙන් උපයෝගී කර ගැනීමට ශ්‍රී ලංකාවට ඉඩ ලැබේ. එහෙත් එවැනි ණය ගැනීම් ඵලදයී ආයෝජනයට හා ණය සේවාකරණ ශක්තිය ඉහළ දැමීමට ඉවහල් නොවන්නේ නම් එමගින් ශුද්ධ වශයෙන් රටින් පිටතට මූර්ත සම්පත් ගලායාමක් සිදු වනු ඇත. ආර්ථික ගැලපුම් ප්‍රතිපත්තීන් තුළින් වර්ධනය ශක්තිමත් කිරීම හා පවත්වාගෙන යාම සඳහා සහනදයක ආධාර හා තාක්ෂණික දැනුම ගලාඒම වැඩි කොට ඒවා ඵලදයී ආයෝජනය කෙරෙහි යොමු කිරීම අවශ්‍යය.

1978 න් පසු ශ්‍රී ලංකාවට ලැබුන විදේශීය ප්‍රාග්ධනයෙන් සැළකිය යුතු කොටසක් සහනදයක කොන්දේසි මත ලැබී ඇත. එහෙත්, විශේෂයෙන්ම රාජ්‍යංශයේ ඇතැම් සංස්ථා මගින් කෙරෙන ආයෝජන සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ඇතුළුව ඉන් කොටසක් ලබාගෙන ඇත්තේ වාණිජ

කොන්දේසි මතය. එබැවින් දැනට උපදවනු ලබන විදේශ විනිමය ඉපැයුම්වලින් පිළිවෙලින් වැඩිවන ප්‍රමාණයන් විදේශීය ණය සේවාකරණය සඳහා වෙන් කිරීම අවශ්‍ය වනු ඇත. මේ අනුව, විදේශීය ණය සම්බන්ධයෙන් හොඳ මාර්ගෝපදේශකයෙකු වශයෙන් සැළකිය හැකි දර්ශකයක් වන ශ්‍රී ලංකා ණය සේවාකරණ අනුපාතය, ණය පරිමාවෙහි වැඩි වීමක් මෙන්ම වැඩි වශයෙන්ම රාජ්‍යාංශයේ සංස්ථාවල විදේශ ණය ගැනීම් කෙරෙහි අදාළවන දැඩි වාණිජමය කොන්දේසි ද පිළිබිඹු කරමින් ඉහළ නැඟීමක් සටහන් කළේය. මුළු ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉහළ අනුපාතයක් වී ඇති නමුදු එය තවමත් පාලනය කළ හැකි සීමාවන් තුළ පවතී. 1986 දී භාණ්ඩ හා සේවාවන් මඟින් වූ විදේශ විනිමය ඉපැයුම්වල අනුපාතයක් වශයෙන් මුළු ණය සේවා ගෙවීම් ප්‍රමාණය (ජා. මූ. අරමුදලට ගෙවීම්ද ඇතුළුව) සියයට 26.3 ක් විය. සමස්ත ණය සේවා-කරණ අනුපාතය (එනම් ණය සේවාකරණය වෙළෙඳ භාණ්ඩ අපනයනය, සේවා හා පෞද්ගලික සංක්‍රාම මඟින් වූ ලැබීම්වල අනුපාතයන් වශයෙන්) සියයට 21.9 ක් විය. ආයෝජන සඳහා ඉහළ ආදයමක් ලැබෙන පරිදි විධිමත් ආර්ථික වර්ධනයකට ප්‍රමාණවත් උපකාරයක් සළසනු වස් ණය සේවා බර අඩු කිරීම සඳහා යටකී තත්ත්වයෙහි වැඩි දියුණුවක් ඇතිකිරීම අත්‍යවශ්‍යය. නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකම කාලානුරූප හා වැඩදායී පියවර ගත යුතුය. ඉහළ ආර්ථික වර්ධන අනුපාතයක් පවත්වා ගෙන යාම සඳහාත්, අස්ථායී-කරණ බලවේග ප්‍රමාණවත් පරිදි කපා හැරීම සඳහාත්, දිගින් දිගටම ක්‍රියාත්මක වන ව්‍යාපාරයක් ඇතිවන බවට වගබලා ගනු වස් උචිත හා ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය පියවර මඟින් ප්‍රබල විදේශීය තත්ත්වයන් පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය වන බව පෙනේ. මෙය වඩාත්ම වැදගත් වනුයේ ආර්ථික වාතාවරණයෙහි වෙනස්වීම් මඟින් විශේෂයෙන්ම සහනදායී ස්වරූපයක් උසුලන විදේශීය ප්‍රාග්ධන ලැබීමේ බලාපොරොත්තුව අඩුකොට ඇති බැවිනි. ජාත්‍යන්තර ක්ෂේත්‍රයෙන් හමා එන මෙවැනි අහිතකර ආර්ථික බලවේග වලින් ඇති වූ කටුක යථාර්ථයෙන් ගැලවිය හැකිද යන්න සිතා ගැනීම අසීරුය.

අහිතකරවූ විදේශීය වාතාවරණයකට මුහුණ පා සිටින ශ්‍රී ලංකාවට ඇති ආර්ථික වෛකල්ප-යන් ක්‍රමක්‍රමයෙන් පටු වෙමින් පවත්නා බව පෙනේ. ඉතිරි කිරීම් අඩු වීමත් දේශීය වෙළෙඳ-පොල කුඩා වීමත් නිසා ප්‍රාග්ධන සම්පාදනය ශක්තිමත් කරනු පිණිස අවශ්‍යයෙන්ම විදේශීය ඉතිරි කිරීම් මත රැඳී සිටීමට ශ්‍රී ලංකාවට සිදු වෙයි. අනෙක් අතට, නිවැරදි දේශීය ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමට ඇය අපොහොසත් වුවහොත් විදේශීය ඉතිරි කිරීම් ගලා ඒමට තුඩුදුන් විශ්වාසය ඉක්මණින් හීනවී යාමට පුළුවන. මෙම ගැටළුව නිසා නුදුරු අනාගතයේදී ආර්ථික ප්‍රතිපත්තියෙහි ප්‍රමුඛතාවය යොමු විය යුත්තේ ආර්ථික මූලිකාංගයන් නිවැරදි කිරීම සඳහාය. මේ සඳහා රාජ්‍ය මූල්‍ය සීමාකිරීමේ ඖෂධය වැඩි වැඩියෙන් පාවිච්චි කිරීමට සිදුවනු ඇත. මේ සම්බන්ධයෙන් ආර්ථිකය රෝගාතුර කළ ප්‍රධාන අසමතුලිතයන් නිවැරදි කිරීම සඳහා උපකාරී විය හැකි ක්‍රියා මාර්ග දැනටමත් යොද ගැනෙමින් තිබේ. 1987 සඳහා අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී, ආර්ථිකයේ ව්‍යුහයාත්මක දුර්වල සාධකයන් නිවැරදි කිරීමෙහිලා උපක්‍රමය නොවෙනස්ව තිබීමේ අවශ්‍යතාවය පිළිගන්නා වූ මැදි කාලීන ප්‍රතිපත්ති රාමුවක් තුළින් අයවැය හිඟය අඩු කිරීමට තමන් බැඳී සිටින බව රජය නැවත වරක් තහවුරු කළේය. මෙම වැඩපිළිවෙල අනුව, 1987 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11 ක් වූ අයවැය හිඟය 1989 දී සියයට 9 දක්වා පහත වැටෙනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ. රාජ්‍ය මූල්‍ය පාලනය දියුණු කිරීම හා වියදම් පිරිමැසීම අරමුණු කොටගත් විධිවිධාන මාලාවක් මඟින් මෙම තත්ත්වය ඇති කර ගැනීමට අපේක්ෂිතය. දැනටමත් ගෙන ඇති සියළුම පියවර තවදුරටත් අනුගමනය කළයුතු අතර, අයවැය තුලනයක් කරා ළඟාවීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හීදී තවත් පියවර ගැනීම රජය විසින් කළ යුතුව ඇත. ජාත්‍යන්තර උපකාරයෙන් ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නය කෙරෙහි විශ්වාසය තහවුරු කිරීමට එම ක්‍රියාමාර්ගය ඉවහල් වනු ඇත.